# වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

ISSN 3121-3529

12 කාණ්ඩය 07 කලාපය

2026 සැප්තැම්බර්

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. ආධාරය රු 70.00



05 දුප්පතාගේ බත් පතට බදු ගහන ජඩ බදු ප්‍රතිපත්තිය



08 22 ආණ්ඩුක්‍රම සංශෝධනය



09 රඳවා තබන සිරගෙවල් සහ දෘෂ්ටිවාදී සිරගෙවල්



10 ජනතා ඉඩම් වෙළඳ භාණ්ඩයක් වූයේ කෙසේද?

# විදුලි ගාස්තු යළිත් ඉහළට?

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් විදුලි බල ක්ෂේත්‍රයට සහනදායී පදනමක් යටතේ ඉන්ධන (දැවි තෙල්) සැපයීම නතර කිරීම සහ නැප්තා හා HFO තෙල් මිල ගණන් 20% කින් පමණ ඉහළ නැංවීම හේතුවෙන් විදුලි ගාස්තු නැවතත් ඉහළ යෑමේ අවදානමක් මතුව තිබේ.**

විදුලි ගාස්තු ස්ථාවරව තබා ගැනීම සඳහා 2026 අප්‍රේල් 18 වන දින ඇති කරගත් තෙමසක ස්ථාවර මිල ගිවිසුමේ කාලසීමාව අවසන් වූ බව ඛනිජ තෙල් සංස්ථාව විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ අනුප්‍රාප්තික සමාගමක් වන 'ජාතික පද්ධති මෙහෙයුම්කරු' වෙත දැනුම් දී ඇත.

මෙම තීරණයත් සමඟ HFO ලීටරයක මිල රුපියල් 210 සිට රුපියල් 248 දක්වාත්, නැප්තා ලීටරයක මිල රුපියල් 174 සිට රුපියල් 210 දක්වාත් ඉහළ ගොස් ඇත.

මෙම ඉන්ධන අතරින් නැප්තා, කැලණිතිස්ස මෙගාවොට් 165ක ධාරිතාවයෙන් යුත් විදුලි බලගාරය සඳහා භාවිත වන අතර, HFO ඉන්ධන මෙගාවොට් 60ක විදුලි බලගාරය, මෙගාවොට් 160ක සපුගස්කන්ද විදුලි බලගාරය සහ කෙරවලපිටිය, යුගදනවි විදුලි බලගාරය සඳහා භාවිත කරනු ලබයි.

මෙම තත්වය තුළ විදුලි ගාස්තු යළිත් ඉහළ දැමීමට ආණ්ඩුවට අවශ්‍ය වුවද එයට ඉඩ නොදිය යුතු බව පෙරටුගාමී සමාජවාදී පක්ෂය අවධාරණය කරයි.

(දෙවන පිටුව බලන්න)




22 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙනුත්, ඊට පක්ෂව ආණ්ඩුව ඉදිරිපත් කරන අදහස්වල ගැටලු සහ විරුද්ධව විපක්ෂයේ දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන අදහස්වල ගැටලු පිළිබඳවත් ජනතාව දැනුවත් කිරීම සඳහා රට පුරා අත්පත්‍රිකා බෙදා හැරීමේ වැඩපිළිවෙළක් පෙරටුගාමී සමාජවාදී පක්ෂය දියත් කළේය. කඳුරුවෙල නගරයේ ජනතාව දැනුවත් කළ අවස්ථාව ඡායාරූපයෙන් දැක්වෙයි.

## අවුරුදු දහයකට ණය ගෙවන්න පුළුවන්!

### මහ බැංකුවෙ අධිපති

මෙරට සිටින විදෙස් තානාපතිවරුන් සමග තිබූ හමුවකදී ඉදිරි වසර දහයක කාලයක් සඳහා ණය ගෙවීමේ හැකියාව තමන් සතු බව මහ බැංකු අධිපතිවරයා සහතික කර තිබේ.

ඒ සඳහා ප්‍රමාණවත් මුදල් සංචිත තමන් සතු බව ඔහු වැඩිදුරටත් පවසයි. ඉදිරි වසර කිහිපයේදී ලංකාවේ නිල විදෙස් මුදල් සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 10 ඉක්මවා යෑමට හැකියාවක් ඇතැයි ඔහු විශ්වාසය පළ කර ඇත. ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ද 2022 වසරට කලින් පැවති අගයන් පසුකර යන බවද ඔහු පවසා ඇත.

02 වැනි පිටුවට..

## අධ්‍යාපන සභාව යනු පෞද්ගලීකරණයේ තවත් පිම්මක්

ගුරුවරුන්, ගුරු උපදේශකයන්, ගුරු අධ්‍යාපනඥයන් සඳහා ඉගැන්වීමේ බලපත්‍රයක් ලබා දෙන බව ආණ්ඩුව පවසයි..

අධ්‍යාපන සභාව බලාත්මක කිරීම සඳහා අවශ්‍ය පනත් කෙටුම්පතක් සැකසීමට දැනටමත් කැබිනට් අනුමැතිය හිමිවී තිබේ. ගුරුවරුන් සඳහා වෘත්තීය බලපත්‍රයක් ලබා දී අධ්‍යාපනයේ ගුණාත්මක ස්වභාවය ඉහළ නැංවීම එහි අරමුණ බවද ප්‍රකාශයට පත්වේ. මේ බලපත්‍රය කාලානුරූපව යාවත්කාලීන කිරීමට නියමිත අතර පෞද්ගලික ටියුෂන් ගුරුවරුන්ට ද මේ බලපත්‍රය අනිවාර්ය වේ. එමෙන්ම මෙම බලපත්‍රලාභී රජයේ ගුරුවරුන්ට තම රැකියා ස්ථානයේ සිට නියමිත කිලොමීටර් ප්‍රමාණයක දුරක් තුල ටියුෂන් කිරිමද තහනම් වන බව ආණ්ඩුවේ හිත්වතුන්

02 වැනි පිටුවට..

## ඉන්දීය ආරක්ෂක ඇමතිගේ සංචාරය ආරක්ෂක ගිවිසුම ක්‍රියාවට නැගීමටලු

ඉන්දීය ආරක්ෂක අමාත්‍ය රාජ්නාත් සිං, සැප්තැම්බර් 9*10 දිනවල මෙරට කෙරෙන සංචාරයේ අරමුණ වන්නේ පසුගිය වසරේ අප්‍රේල් මාසයේදී අත්සන් කරන ලද ආරක්ෂක සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම (MoU) ක්‍රියාත්මක කිරීම සඳහා බලපෑම් කිරීම බව වාර්තා වේ.

ආරක්ෂක අවබෝධතා ගිවිසුම යනු පවතින ආරක්ෂක සහයෝගීතාව විදිමත් කිරීමේ ලේඛනයක් වන අතර එය ඒකාබද්ධ අභ්‍යාස, විවිධ ක්ෂේත්‍රවල ධාරිතා වර්ධනය, මානුෂීය ආධාර සහ ආපදා සහන (HADR) හුවමාරු කිරීම්, දෙරටේ නාවික ඒකක මගින් වරාය ඇමතුම් වැඩි කිරීම සහ දෙපාර්ශ්වය අතර ආරක්ෂක කර්මාන්ත සහයෝගීතාව වර්ධනය කිරීම වැනි ක්ෂේත්‍රවලට අදාළය.

කෙසේවුවද 2025 අප්‍රේල් 5 වන දින අගමැති නරේන්ද්‍ර මෝදිගේ ශ්‍රී ලංකා සංචාරයේදී හුවමාරු වූ ද්විපාර්ශ්වික ලේඛන හතෙන් එකක් වන මෙම ආරක්ෂක අවබෝධතා ගිවිසුම නවදිල්ලියේ හෝ කොළඹදී ප්‍රසිද්ධ කර නොමැතිවීම ආන්දෝලනයට හේතු වී ඇත. මෙරට ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා සහ ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් සම්පත් තුයියකොන්තා විසින් මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කරණ ලදී.

රාජ්නාත් සිං ඉන්දිය ආරක්ෂක ඇමති ධුරයට පත්ව මෙරට කරන පළමු සංචාරයේදී, මෙරට ආරක්ෂක ඇමති ධුරය දරන ජනාධිපති අනුර කුමාර දිසානායක, අගමැතිනි හරිනි

02 වැනි පිටුවට..

## ඇඟළුම් අපනයන ආදායම බිඳවැටීමේ අනතුරක!

ලංකාවෙන් එක්සත් ජනපදයට කෙරෙන රෙදිපිළි හා ඇඟළුම් අපනයනයන්ගේ ආදායම 8.55%කින් බිදිවැටී ඇතැයි වාර්තා වෙයි. එය 2026 ජුලි මාසයෙන් අවසන් වූ වසරේ ආදායම එයට පෙර වසරේ ආදායමට වඩා අඩුවීමෙන් පෙන්නු ම් කරයි. ලංකාවේ ප්‍රධානතම රෙදිපිළි හා ඇඟළුම් අපනයන වෙළඳපොල එක්සත් ජනපදයයි.

2025 ජුලි මාසයට සාපේක්ෂව 2026 ජූලි මාසයේදී එක්සත් ජනපදයට කරනු ලැබූ සම්පූර්ණ අපනයනයද 6.22%ක් ලෙස ඩොලර් මිලියන 167.18කින් පහත වැටී තිබේ. එය 2022 ජූලි මාසයෙන් පසු වාර්තා වූ අවම අගයයි.

මීට සමාන්තරව

02 වැනි පිටුවට..

විදුලිය ගාස්තු නැවත වැඩි කිරීමේ ආණ්ඩුවේ උත්සාහයට ඉඩ නොදෙන ලෙස ඉල්ලා සැප්තැම්බර් 02 පෙරටුගාමී සමාජවාදී පක්ෂය වෙනුවෙන් පුබුදු ජයගොඩ සහෝදරයා විසින් විසින් මහජන උපයෝගිතා කොමිසමට භාරදෙන ලද ලිපිය මෙසේය.

# විදුලි ගාස්තු වැඩි නොකරන ලෙස ඉල්ලා පෙ.ස.ප. මහජන උපයෝගිතා කොමිසමට

විදුලි ගාස්තු වැඩි නොකරන ලෙස ඉල්ලා සිටීම

2026 වසර සඳහා ගෙන්වූ ගල් අඟුරු තත්වයෙන් බාල නිසා එමගින් අපේක්ෂිත විදුලි ධාරිතාව නිෂ්පාදනය කරගත නොහැකි විය. ඒ අතර ටෙන්ඩර් ක්‍රියාවලියේ ගැටලු හේතුවෙන් ගල් අඟුරු තොග අවසන් වෙමින් තිබේ. පියසි මත සූර්ය පැනල අධෛර්යමත් කිරීමට ආණ්ඩුව ගත් තීරණයත් සමග පුනර්ජනනීය බලශක්තියෙන් එම අඩුව පිරවීමද ගැටළුකාරීය. මේ තත්වය යටතේ ඉන්ධන වලින් විදුලි නිෂ්පාදනය සඳහා වැඩි අවශ්‍යතාවක් ජනිත වනු ඇත. නමුත්, විදුලිය නිෂ්පාදනය සඳහා ලබාදෙන ඉන්ධන සහනාධාරය මේ මස සිට අවසන් කෙරෙනු ඇත. එමෙන්ම ඒ අතර ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව විදුලිය නිෂ්පාදනය සඳහා ලබාදෙන නැප්තා සහ දැවිතෙල් මිල විශාල ප්‍රතිශතයකින් ඉහළ දැමීමට තීරණය කර තිබේ.

මේ තත්වය යටතේ ආණ්ඩුව විදුලි ගාස්තු ඉහළ නැංවීමට තීරණය කර ඇති බව අපට වාර්තා වන අතර පද්ධති පාලන සමාගම විසින් එම ඉල්ලීම ඉදිරියේදී මහජන උපයෝගිතා කොමිසමට ඉදිරිපත් කරනු ඇත. අප්‍රේල් මාසයේ සිට දිගින් දිගටම උද්ධමන අනුපාතිකය 5-7% ප්‍රතිශතයකින් ඉහළ ගිය අතර අගෝස්තු මාසයේ එම අගය 8%කි. ආදායම් වැඩි නොවී වියදම් වැඩිවන තත්වයක් යටතේ ජනතාව බරපතළ දුෂ්කරතාවයක සිටින අතර විදුලි ගාස්තු වැඩිවීමක් විසින් විදුලි පාරිභෝගික ජනතාව විශාල පීඩාවකට ලක්වනු ඇත. එබැවින් එවැනි ඉල්ලීමකට ඉඩ නොදෙන ලෙස විදුලි පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් උදෙසා නෛතිකව පිහිටුවනු ලැබූ ආයතනයක් ලෙස ඔබ කොමිසමෙන් ඉල්ලා සිටිමු.

එමෙන්ම,

1. පසුගිය කාලයේ ඉන්ධන මගින් විදුලිය නිෂ්පාදනය කිරීමේ පිරිවැය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති සංඛ්‍යාලේඛන සැක සහිත බැවින් ඒ පිළිබඳ පූර්ණ විගණනයක් සිදු කරන ලෙසද,

2. ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු වලින් සිදුවූ අලාභය පාරිභෝගිකයා මත නොපටවන ලෙස කොමිසම තීරණයක් ගෙන තිබියදී, ඉන්ධන මගින් කෙරෙන විදුලි නිෂ්පාදන පිරිවැය හරහා එය අය කරගෙන තිබේ දැයි විමර්ශනයක් කරන ලෙසද,

3. ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව හදිසියේ නැප්තා සහ දැවිතෙල් මිල වැඩි කිරීමට සාධාරණ හේතු තිබේදැයි විමර්ශනයක් කරන ලෙසද,



4. විදුලිය නිෂ්පාදනය සඳහා ලබාදෙන ඉන්ධන සහනාධාරය තවත් මාස කිහිපයකට දීර්ඝ කිරීම සඳහා රජයෙන් ඉල්ලීමක් කරන ලෙසද,

5. ගල් අඟුරු තොග මෙතරම් ඉක්මනින් අවසන්වී, ගල් අඟුරු නැව් දෙකක පමණ හිඟයක් ඇතිවූ හේතුව ගැන විමර්ශනයක් කරන ලෙසද,

6. පියසි මත සූර්‍ය පැනල අධෛර්යමත් කිරීමේ තීරණය පිටුපස යම් අල්ලසක් හෝ දූෂණයක් තිබේදැයි විමර්ශනයක් කරන ලෙසද,

7. ඉන්ධන භාවිතයෙන් විදුලිය නිෂ්පාදනය කිරීමේ පිරිවැයට අදාළ මහජන අදහස් කැඳවීමේ ප්‍රගතිය සම්බන්ධ වාර්තාවක් ලබාදෙන ලෙසද, කොමිසමෙන් ඉල්ලා සිටිමු.

01 පිටුවෙන් ..

## අවුරුදු දහයකට....

ඒ හරහා ලංකාවේ ණය තිරසාරකත්වය ස්ථාවර බව පැහැදිලි කිරීමට මහබැංකු අධිපතිවරයා උත්සාහ කරයි. ඒ හරහා ජාත්‍යන්තර ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම්වලදී ccc කාණ්ඩයේ සිට B කාණ්ඩයේ රටක් බවට ලංකාව පත්කර ගැනීමට ආණ්ඩුව උත්සාහ කරයි. එනයින් තවත් විශාල ණය ප්‍රමාණයක් ලබා ගැනීමේ හැකියාව සම්බන්ධව විශ්වාසය විදෙස් ණය හිමියන් වෙත ලබාදීමටද උත්සාහ කරයි.

මෙහිදී ආණ්ඩුව පෙන්වා දෙන්නේ 2022 වන විට පැවැති දළ දේශීය නිෂ්පාදිතයෙන් 8% ක් වූ රාජ්‍ය ආදායම වර්තමානයේ වනවිට 16%දක්වා දෙගුණ කර ඇති බවයි. ජාත්‍යන්තර මූල්‍යය අරමුදලේ බලපෑම අනුව මෙරට ප්‍රාථමික ගිණුම් අතිරික්තය 2.3% ට වැඩි අගයක පවත්වා ගැනීමට හැකිවීම ජයග්‍රහණයක් ලෙස මහා බැංකු අධිපතිවරයා උදම් අනයි.

නමුත් සත්‍ය තත්වය මෙයට හාත්පසින්ම වෙනස්ව ඇති අතර සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය වේගයෙන් බිඳ වැටී තිබේ.

රටේ පවුල් ඒකක ලක්ෂ 61න් ලක්ෂ 37ක්ම මේ වනවිට ඇස්වැසුම සහනාධාර සඳහා ඉල්ලුම් කර තිබේ. එම කුටුම්භවලින් ලක්ෂ 34ක් ආහාර අනාරක්ෂිතතාවයට ගොදුරු වී තිබේ. රටේ ජනගහනයෙන් 22% ක් ජීවත් වන්නේ දරිද්‍රතා මට්ටමේය. උද්ධමනය 7%ක් දක්වා ඉහළ නැග තිබේ.

කෙසේ වෙතත් මේ වන විට ලංකාවේ නිල විදෙස් මුදල් සංචිතයේ වටිනාකම ඩොලර් බිලියන 6.8කි. ඒ අතර ඊනියා ණය ප්‍රතිව්‍යුහගතකරණය අනුව ඉදිරි දශකයේදී මෙතෙක් ලබාගෙන ඇති විදෙස් ණය වර්ෂයකට ඩොලර් බිලියන 4 බැගින් ගෙවිය යුතුය. ඒ සඳහා සංචිත සැපයීමට රටේ විදෙස් අපනයන ප්‍රමාණය වාර්ෂිකව ඩොලර් බිලියන 20ක් දක්වාවත් වර්ධනය කළ යුතුය. මෙතෙක් ලංකාවට පනවා ඇති ආනයන අපනයන හා දේශීය නිෂ්පාදනය කප්පාදු කිරීමේ කොන්දේසි අනුව එම අගය ඉක්මවා යෑම කිසිසේත්ම යථාර්ථයක් නොවේ. ලෝක ආර්ථිකයේ බිඳ වැටීම් හමුවේ විදෙස් ප්‍රේරණ හා සංචාරක කර්මාන්තයේ හැසිරීම පුරෝකතනය කිරීම සැක සහිතය.

ඒ අනුව නිශ්චිතවම මහ බැංකු අධිපතිවරයා සහ ආණ්ඩුව මේ හැරෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝක බැංකුව හා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන්ගේ ණය උගුල වෙත බව පැහැදිලි වේ.

## අධ්‍යාපන සභාව....

ප්‍රචාරය කරන බවද නිරීක්ෂණය වී තිබේ.

එමෙන්ම මෙම පනත් කෙටුම්පත හරහා පෞද්ගලික අංශයේ අධ්‍යාපන ක්‍රියාවලිය නියාමනය කිරීමේ බලයක් ද සහිත ආයතන ව්‍යුහයක් නිල වශයෙන් ස්ථාපනය කිරීමට ආණ්ඩුව උත්සාහ කරන බවට දැනටමත් චෝදනා එල්ල වී තිබේ.

වර්තමානයේ රජයේ වගකීමක් ලෙස පවතින රටේ අධ්‍යාපන පද්ධතිය බොහෝ දුබලතාවයන්ගෙන් පිරී ඉතිරී ගොස් ඇති බව නොරහසකි. එය රටේ සියලු දරුවන්ට සමාන, සාධාරණ හා නිදහස් අධ්‍යාපන අවස්ථා සහතික නොකරයි. එසේ වුවද එම පද්ධතිය තවමත් රටේ සාමාන්‍ය ජනතාවගේ දූ දරුවන් මිලියන හතරකට වැඩි ප්‍රමාණයකට අවම හෝ අධ්‍යාපන අවස්ථා සලසා දේ.

එහෙත් 240,000 පමණ වන රටේ ගුරු ප්‍රජාවගෙන් වසරකට විශ්‍රාම ගැනෙන 7,500ක් නිසා ඇතිවන ගුරු පුරප්පාඩු පිරවීම සඳහා විද්‍යාත්මක වැඩපිළිවෙළක් ආණ්ඩුව යෝජනා නොකරයි. ඒ සඳහා අත්‍යවශ්‍ය ගුරු සංගණනයක් හා ගුරු තුළනයක් දීර්ඝ කාලයක් තිස්සේ සිදුකෙරී නැත.

රාජ්‍ය විශ්ව විද්‍යාල වලින් පිට වූ ඉහළම ගුණාත්මක අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් සහිත අධ්‍යාපනවේදී උපාධිධාරීන් වසර දෙකකින් ගුරු සේවාවට බඳවාගෙන නැත.

ගුරු වෘත්තීය නිපුණතා සංවර්ධනය සහ යාවත්කාලීන කිරීම සඳහා අධ්‍යාපන කලාප මට්ටමින් පවත්වාගෙන යනු ලබන ගුරු මධ්‍යස්ථාන සඳහා අත්‍යවශ්‍ය ගුරු අධ්‍යාපනඥයන්ගේ හිඟයක් තිබේ.

ප්‍රාථමික පන්තියක සිටිය යුතු උපරිම සිසුන් සංඛ්‍යාව 25 ක් වුවද පාසල්වල ප්‍රාථමික පන්තිවල සිසුන් 40ක් දක්වා පවත්වා ගැනීමට උපදෙස් ලබා දී තිබේ. සෑම සිසුවෙක් කෙරෙහිම ගුරුවරයාගේ පෞද්ගලික අවධානය තදින්ම අත්‍යවශ්‍ය ප්‍රාථමික පන්තියේ දරුවන්ගේ මූලික අධ්‍යාපනික ගොඩනැංවීම් මේ නිසා මගහැරී යයි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ද්විතියික අධ්‍යාපනයේදී පාසල අතහැර යයි.

ඒ අතර රටේ පාසැල් වලින් 37% කට පානීය ජල පහසුකම් නොමැත. පාසල් වලින් 3%කට විදුලිය නොමැත. එක් පරිගණකයක් සහිත සහිත පාසල් ද සලකා බලන්නේ නම් පරිගණක සහිත පාසල් ප්‍රතිශතය 69%ක් පමණකි.

එමෙන්ම සිසුන් 50 ට අඩු පාසල් වසා දැමීමටද ආණ්ඩුව සැලසුම් කරයි.

මේ අනුව මතුපිට කරුණු දැක්වීම් අනුව අත්‍යවශ්‍ය ස්වරූපයක් ප්‍රකාශ කළද, මෙම යෝජිත අධ්‍යාපන සභා පනත පදනම් වන්නේ පෞද්ගලික අධ්‍යාපන ක්‍රියාවලිය නියාමනය කිරීමේ අවශ්‍යතාවය වෙනුවෙන්ම බව පැහැදිලි වෙයි.

එය 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාවේ සිට මෙරට නිදහස අධ්‍යාපනය කප්පාදු කිරීමට ගත් ඉතා තීරණාත්මකම කාර්යභාරයක් වෙනු ඇත..

## ඇඟළුම් අපනයන....

2026 ජනවාරි - ජූලි කාලය තුළ එක්සත් ජනපදයට කළ අපනයනවල වටිනාකම පසුගිය අවුරුදු පහේ වාර්තා කල අඩුම අගය වූ ඩොලර් මිලියන 1057.61ක් ලෙස වාර්තාවේ. එම අගය 2024 වසරේදී ඩොලර් මිලියන1058.34ක් විය.

එම කාලය තුළම යුරෝපා සංගමයට කළ අපනයන 8.41%කින්, එක්සත් රාජධානියට කළ අපනයන 6.72%කින් හා වෙනත් වෙළඳපොළ සඳහා කළ අපනයන 15.67% කින් බිඳ වැටුනද එම අගයන් 2023 වසරේ අදාළ කාලයේ අගයන්ට වඩා ඉහළ අගයක් ගනියි.

2026 වසරේ පළමු අර්ධයේදී එක්සත් ජනපදය විසින් ලංකාවේ අපනයනයන්ට පැනවූ ඉහළ බදු අනුපාතය හා බලහත්කාරී ශ්‍රමය වැළකීම වැනි කොන්දේසි ඉවත් කර ගැනීමට ලංකාවේ ආණ්ඩුවට වැඩි කාලයක් ගතවූ බවද මෙහිදී නිරීක්ෂණය වේ. එහෙත් එම කාලය තුළින්ම ලංකාවේ තරගකරුවන් වන බංග්ලාදේශය කාම්බෝජය පකිස්ථානය හා ඉන්දුනීසියාව උපක්‍රමිකව තමන් මත යෙදෙවූ බදු ප්‍රතිශතයන් අඩුකර ගැනීමට සමත් විය.

කොවිඩ් වසංගත තත්වය හා ආර්ථික අර්බුදය සමග 2023 දී ලංකාවේ රෙදිපිළි හා ඇඟළුම් අපනයනය 18%කින් බිඳ වැටුණි. පසුව 2025 වසරේදී ඩොලර් බිලියන 5.5ක අපනයන ආදායමක් ලබා ගැනීමට ඇඟළුම් ක්ෂේත්‍රයට හැකි විය.

කෙසේ වුවද මේ වන විට ඇඟළුම් අපනයන ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන ගැටලු නිසා මිලට මෙරට ප්‍රධාන ආයතන කිහිපයක්ම සිය කර්මාන්තශාලා වසා දැමීමට උත්සාහ කරමින් සිටී.

ලංකාවේ ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියාවේ නියුතු ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව 350,000ක් පමණ වන අතර ඔවුන්ගෙන් යැපෙන්නන් සංඛ්‍යාව මිලියනයක් පමණ වේ.

## ඉන්දිය ආරක්ෂක....

අමරසූරිය සහ ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් සම්පත් තුයියකොන්තා සමග සාකච්ඡා පවත්වනු ඇති බවද ත්‍රිවිධ හමුදාපතිවරුන් හමුවනු ඇති බවද පැවසේ.

ඉන්දිය අගමැති නරේන්ද්‍ර මෝඩි පසුගිය වසරේ කළ සංචාරයේදී මෙන්ම පසුගිය මස ඉන්දීය විදේශ ලේකම් වික්‍රම් මිස්රි කොළඹ කළ සංචාරයෙන් පසුව දෙරට අතර ගිවිසුම් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතා ඇතිව තිබේ. ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රකාශයකට අනුව, විදුලිබල ජාල සබඳතා ව්‍යාපෘතිය, සාම්පූර් සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සහ ත්‍රිකුණාමලය බලශක්ති මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම ඇතුළු බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමේ ක්‍රම පිළිබඳව දෙපාර්ශ්වය සාකච්ඡා සිදු විය. මෙරට ඩිජිටල් හැඳුනුම්පත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ටෙන්ඩර් ක්‍රියාවලිය ඉක්මනින් අවසන් කිරීමටද එකඟතා ඇතිව තිබේ. තවද, ඇමරිකානු ඩොලර් මිලියන 61.5 ක ප්‍රදානයක් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත කන්කසන්තුරේ වරාය ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීම සහ නවීකරණය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අවසන් කිරීම සඳහා සාකච්ඡා ඉක්මනින් ආරම්භ කළ යුතු බවට ඉන්දිය පාර්ශ්වයෙන් යෝජනා වී ඇත.



වම
පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත
අංක 22/1, මෙල්ඩර් පෙදෙස, නුගේගොඩ.
flsocialistparty@gmail.com
wama.editor@gmail.com

# 'තේ දල්ලේ රත' සහ සටන්කාමයේ සංකේත

කඳුකරයේ සීත දේශගුණය උණුසුම් කරමින් රක්ත වර්ණ තේ දල්ලක් දිලින්නේ යැයි සාහිත්‍යකරුවෝ ලියති.

එහෙත් ඒ තේ දල්ල දිලෙන්නේ කඳුකර තමිල් ජනතාවගේ රුහිරෙන් බව ඊට එකතු කළ යුතුව ඇත. සමහර විට මෙවැනි ප්‍රකාශවල සීමාව තේ දල්ල පිළිබඳ සාහිත්‍යයික රෝමැන්ටික අදහස්වලට එහා යයි. වාර්ෂිකව තේවතු හිමියාගේ ගිණුමට ඩොලර් වැටෙන්නේ ඒ සීමා සියල්ල ඉක්මවමිනි. ඉන්නට හිටින්නට හරිහමන් ගෙයක් දොරක් හෝ තමන්ගේම යැයි කියා බිම් අඟලක් හෝ නැති කඳුකර තමිල් ජනතාව පරම්පරා ගණනාවක් තිස්සේ තම ශ්‍රමය දෙකයි පනහටත් අඩු වැටුපකට කැඹුරු බව දන්නා සාහිත්‍යකරුවෝ අල්පයහ.

මිනිස් සමාජමය සබඳතා ජාලය අහිමි ව අසරණ වූ මේ මිනිසුන් වෙනුවෙන් ඔවුන්ගේ දහසක් දෛනික දුක්ඛ දෝමනස්ස හා නීතිමය කටයුතු වලදී ඔවුන්ගේ එකම ගැලවුම්කරුවා තලයිවර් හෙවත් නඩ නායකයා පමණකි. එහෙත් ඔහුද ඔවුන් වෙනුවෙන් පෙනී සිටින්නේ මාසයකට රුපියල් 150/= හෝ ඊට වැඩි සාමාජික මුදලක් ඔවුන්ගේ වෘත්තීය සමිතියට ගෙවන්නේ නම් පමණකි. ලංකාවේ සාමාන්‍ය කම්කරු සමිතියක වැඩිම සාමාජික මුදල මෙය බව රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික අංශවල වෘත්තීය සමිති සාමාජිකයෝ කිසිවෙක් නොදනිති. ඒ ඔවුන් ගෙවූ සාමාජික මුදල ඊට වඩා බොහෝ සෙයින් කුඩාවන අතරය.

දෛනිකව නෙළාගත යුතු වූ තේ දළු ඉලක්කය කිලෝ ග්‍රෑම් 20ක් බවද, එම අස්වැන්න කිරන්නේ දෙපැත්ත නොපෙනෙන කිරන්නාට පමණක් කියවා ගත හැකියි බැලන්සයකින් බවද කිසිවෙක් වාර්තා කරන්නේ නැත. ග්‍රෑම් 200ක් වත් බර නැති පොලිසැක් මල්ලේ බරයැයි කියා කිලෝ ග්‍රෑම් 1.5ක් දෛනික අස්වැන්නේ බරින් අඩු කරන අතර ඊට විරුද්ධ වන්නෙකුට ඊළඟ දවසේ වැඩ නොලැබෙනු ඇත. එලෙස දෛනික නෙලාගත් දළුබර කිලෝ 20 ට අඩු ලෙස සටහන් වන්නේ නම් ඊට හිලව්වට දවසේ වැටුපෙන් භාගයක් කපා හැරේ. ඉදින් බොහෝ සටන් කොට දිනාගත් රු.1750/= ක දෛනික වැටුපෙන් අඩක් එනම් රුපියල් 875/= ට කාටත් වැඩ කරන දවසකට ආණ්ඩුවෙන් ගෙවන 200/= එකතු වුවද එයින් කළ හැක්කේ කුමක්ද?

එසේම අනෙක් අතටත් මාසයේ දින 25ම කිසිදු පුද්ගලයකුට වැඩ නොලැබෙන ලෙස 'පේරෝල් බැලන්ස්' කරන ලෙස කංගානිට හෝ සුපර්වයිසර්ට ඉහළින් උපදෙස් ලැබෙද්දී තනි තනි කම්කරුවන්ට කළ හැකි කිසිවක් නැත. ඒ සියල්ලටම යටත්ව රටේ මන්ද පෝෂණයෙන්, දුප්පත්කමෙන් හා නූගත්කමෙන් වැඩියෙන්ම පීඩාවට පත් ජනතාව තමන් බව ඔවුන් දන්නේ නැත. වත්මන් යුගයේ අප්‍රකාශිත වහල් භාවය එබඳුය.කෙටියෙන් කිවහොත් කවදාක හෝ මියගිය පසු වැලලෙන්නටද රියන් හතරක් ඔවුන්ට අහිමිය. සැබෑ ජනතා අයිතීය නොසලකා කඳුකරයේ රජයේ තේ ඉඩම්වල අවසාන අඟල දක්වා ධන කුවේරයන්ට විකුණා දැමීමට පිඹුරුපත් සකසා ඇත. වතුකම්කරු ජනයා, එනම්, මලෛයහ තමිල් ජනයා සිටින්නේ කබලෙන් ලිපට වැටෙන පසුබිමකය.

භාෂාව ආගම සංස්කෘතිය කුමක් වුවද කිසිවකුගේ හෝ මිනිස් අයිතීන් අහිමි කර දැමීමට කිසිවකුටත් අයිතියක් නැත. බළුහෙත් මේ සුවිශේෂී පීඩාව ඔවුන්ට වසර 200කට අධික කාලයක් පුරා විඳින්නට සිදුව තිබේ. කඳුකරයේ සේලවරාජ්ලා, අම්බිකාලා මැතිවරණ වේදිකාවල සිය ජනයා වෙනුවෙන් නැගූ හඬ වෙනුවෙන් දේශපාලන නායකත්වයක් දෙන්නට කිසිවකු නැත.ඔවුන් ද ඔවුන්ගේ ජනයා මුලා කර ඇත.

එසේම ඉතිහාසයක් පුරා පාගාදැමීමට සූරා කෑමට නොසලකා හැරීමට හා මරණයට අත්හැර දමා ඇති ඒ සහෝදර මිනිස් කැලත වෙත හුදු ලිබරල්වාදී මනුෂ්‍යත්වයේ දෑත් දිගු කිරීමෙන් පමණක් පලක් නැත.

පන්ති සටනේ මුවහත් මතවාදී අවිද,ඒ අවිදැරීම සඳහා පුළුල් නිර්ධන පංති සවිඥානිකත්වයද, සවිමත් ලෙස බෙදා ගැනීමට අප සූදානම් විය යුතුය.

# ජීවිතයේ සැඳෑ සමය වෙනුවෙන්

අපි ජීවත් වුණේ තරමක් පිටිසර ප්‍රදේශයක. අම්මයි තාත්තයි වයසට යද්දි ඉක්මනින් රෝහලකට යා හැකි, බස් එකක් ගත හැකි ප්‍රධාන පාරට වැඩි දුරක් නැති තැනක පදිංචියට යන්න අපට ඕන වුණා. පවුලේ රැකියාවක් කළේ තාත්තා විතරයි. ඒකත් දෛනික වැටුප් සහිත රැකියාවක්. නමුත් තාත්තා තරුණ කාලයේ කර්මාන්ත ශාලාවක වැඩ කරලා තිබුණා. අපි තාත්තාගේ EPF එක ගැන සොයලා බැලුවා. තරමක ලොකු මුදලක් එහි තිබුණා. ඒ වන විට අපි පදිංචිව සිටි ඉඩමත් විකුණලා, EPF එකත් අරගෙන ඒ සියලු මුදල් එකතු කරලා අපි සොයපු පහසුකම් ඒ විදියටම නැතත් ඒ තරම් නරක නැති තැනක පදිංචියට එන්න අපට පුළුවන් වුණා. ඒ වෙලාවේ පිහිටට ආවේ EPF අරමුදල.

මේක අපේ අත්දැකීම විතරක් නොවෙයි. EPF එකේ සල්ලි ස්ථාවර තැන්පතුවල (Fixed Deposit) දාලා ඒකෙ පොලියෙන් ජීවත් වන බොහෝ දෙනෙක් ඉන්නවා. ඒ වගේම EPF එකෙන් එකසැරේ තරමක ලොකු මුදලක් ගන්න පුළුවන් නිසා ඒක ආයෝජනය කරලා ජීවිතයේ සැඳෑ සමයේ පුංචි ආදායම් මාර්ගයක් හදා ගෙන ජීවත් වෙන විශාල පිරිසක් ඉන්නවා.

අවුරුදු පනහක් හැටක් ජාතික ආර්ථිකය වෙනුවෙන් දහඩිය හෙළන මිනිස්සුන්ට අතපය වාරු නැති වැඩි මහළු වියසට ආවට පස්සේ කාටවත් අතපාන්නෙ නැතිව ජීවත් වෙන්න ක්‍රමයක් ඕන. රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුප තිබෙනවා. පෞද්ගලික අංශයේ සේවකයන්ට තියෙන්නේ සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල. නමුත් ස්වයං රැකියා කරන අයට, ගොවීන්ට සහ තවත් දහස් ගණනක් අවිධිමත් වෘත්තීන්වල නියැලෙන අයට ඒ රැකවරණය නැහැ. ඒකත් ගැටලුවක්. එහෙම තියෙද්දිත් පෞද්ගලික අංශයේ අයට EPF එක හරි තියෙනවා.

අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල වැනි සමාජ ආරක්ෂණ ක්‍රම බිහි වුණේ කම්කරුවන් ජීවිත පරිත්‍යාග යෙන් කළ අරගලවල ප්‍රතිඵලයක් විදියට. ඒ නිසා ඒක පෞද්ගලික අංශයේ සේවකයන් දිනා ගත් දෙයක් මිසක් පාලකයන්ගෙ හිත හොඳකම නිසා ලැබුණු දෙයක් නොවෙයි.

සේවක අර්ථ සාධක අරමුදල ඉතා විශාල අරමුදලක්. මේ වන විට එහි




සමස්ත වටිනාකම රුපියල් ට්‍රිලියන පහත් ඉක්මවා ගොස් තිබෙනවා. සෑම වර්ෂයකට රාජ්‍ය ආදායමට සමාන මුදලක් සේවකයන්ගේ දායක මුදල් ලෙස මෙම අරමුදලට බැර වෙනවා. ඒ නිසා කෑදරකමින් පිරුණු කොම්පැණිකාරයන් මේ අරමුදලට කෙළ හැළුවේ අද ඊයේ සිට නොවෙයි.

මේ අරමුදල දැන් පාලනය වෙන්නේ කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ. මේ ආයතනවල දැඩි නීති රීති නිසා මේ අරමුදල අවභාවිත කරන්න තියෙන අවස්ථාව ඉතාමත්ම සීමිතයි. මේ අරමුදලේ මුදල් ආයෝජනවලින් 90%ක්ම යොදවලා තිබෙන්නේ භාණ්ඩාගාර බැඳුම්කරවල. ඒ කියන්නේ රජයට ණය දෙන්න. ඒක සුරක්ෂිත ක්‍රමයක්. 10% කට අඩු ප්‍රමාණයක් තමයි පෞද්ගලික අංශයේ ආයෝජනය කර තිබෙන්නේ. ඒ ආයෝජන පාඩු වීම ගැන තමයි පසුගිය කාලයේ කතාබහට ලක් වුණේ. ඒ නිසා ගැටලු තිබුණත් දැන් අරමුදල කළමනාකරණය වෙන්නේ ආරක්ෂාවක් සහිත තත්වයක් තුළයි.

නමුත්, මේ දැවැන්ත අරමුදල කම්කරු දෙපාර්තමේන්තුවේ හා මහබැංකුවේ පාලනයෙන් ගලවලා ඊනියා 'ස්වාධීන' මණ්ඩලයකට පවරන්න කියලා 2023 වසරේ ඉඳලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල බලපෑම් කරනවා. මෙහි අරමුණ මේ අරමුදලේ තිබෙන මුදල් කොටස් වෙළඳපොළේ සහ වෙනත් අවදානම් ආයෝජනවල යොදවන්න දැනට තිබෙන බාධා ඉවත් කර ගැනීම.

රනිල්ටත් කර ගන්න බැරි වුණු මේ තුච්ඡ ප්‍රතිසංස්කරණය සම්පූර්ණ කිරීමේ වගකීම වත්මන් මාලිමා ආණ්ඩුව බාර ගෙන තිබෙනවා. මහින්දලා රනිල්ලා මේ ප්‍රතිසංස්කරණය ගෙන එද්දි ඊට තර්කාන්විතව විරුද්ධ වූ ජනතා විමුක්ති පෙරමුණ දැන් නැට්ට දෙපරුන්ද අස්සේ ගහගෙන 'කීක්... කීක්.' ගාලා මූල්‍ය අරමුදල හා ලංකාවේ මහා පරිමාණ ජාවාරම්කාරයන්ගේ දෙපා මුල වැටිලා ඉවරයි.

රනිල්ට කරන්න බැරි වුණු, අනුර කරන්න යන නීති සංශෝධනයට අනුව සේවක අර්ථසාධක අරමුදල හා භාරකාර අරමුදල කම්කරු දෙපාර්තමේන්තුවෙන් හා මහ බැංකුවෙන් ඉවත් කර රජය, වෘත්තීය සමිති හා හාම්පුතුන් යන පාර්ශ්ව තුන ඉන්න මණ්ඩලයකටම පවරන්න යනවා. බැලූ බැල්මටම මේ මණ්ඩලයට සේවකයන්ට අවාසිසහගතයි. මෙතන සේවකයන් වෙනුවෙන් පෙනී ඉන්නෙ වෘත්තිය සමිති විතරයි. රජය සහ හාම්පුතුන් පෙනී ඉන්නේ එක් පාර්ශ්වයක් විදියට බව අපි අත්දැකීමෙන්ම දන්නවා. ඒ නිසා මේ මණ්ඩලය හදද්දිම සේවකයන් අගතියට පත්වෙනවා.

ඊළඟට මේ අරමුදල මහ බැංකුවේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන් මිදෙන නිසා ඉතාම අවදානම් තැන්වල ආයෝජනය කරන්න තිබෙන බාධා ඉවත් වෙනවා. එවැනි ආයෝජනයක් ගැන තීරණ ගනිද්දි රජය හා හාම්පුතුන් ඉන්නේ එකම පැත්තේ නිසා වෘත්තීය සමිති කොච්චර විරුද්ධ වුණත් ඒ විරෝධය නාමමාත්‍රික විරෝධයක් විතරක් බවට පත් වෙනවා. යම්හෙයකින් එම ආයෝජන පාඩු වුණොත් ඒ පාඩුව මුළුමනින්ම දරන්න වෙන්නේ සේවකයන්ට. මොකද මේ අරමුදලේ තිබෙන්නේ සේවකයන්ගේ මුදල් මිස රජයේ හෝ හාම්පුතුන්ගේ මුදල් නොවෙයි.

අනෙක් කරුණ වෙන්නේ මේ මණ්ඩලයේ නියෝජනය තිබෙන්නේ සංවිධානාත්මක විශාල වෘත්තීය සමිතිවලට. සුළු හා අස්ථිර සේවකයන්ගේ හඬ මෙතන නියෝජනය වෙන්නේ නෑ. කලින් ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කළේ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්. නමුත් මේ නව මණ්ඩලය පත් කළාට පසුව කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නිෂ්ක්‍රිය වෙනවා.

හාම්පුතුන් සේවකයන්ගේ EPF, ETF නියමිත පරිදි ගිණුම්වලට බැර නොකරන අවස්ථාවලදී දැන් සිදු වෙන්නේ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මැදිහත් වෙලා නෛතික ක්‍රියාවලි හරහා ඒ මුදල් කම්කරුවන්ට අය කරදීම. නව මණ්ඩලය ස්ථාපිත වුණාට පසුව ඒ ක්‍රියාවලිය නතර වෙනවා. පැමිණිලි කරන්න වෙන්නේ හාම්පුතුන්ද වාඩි වී සිටින මණ්ඩලයටමයි. සමාගම් විසින් ගෙවිය යුතු වැට් බද්දවත් අය කර ගන්න මැදිහත් නොවන ආණ්ඩු මෙවැනි පැමිණිලි හමුවේ හාම්පුතුන්ගේ පැත්ත අරගෙන සේවකයන්ගේ පැමිණිලි යට ගහන බව අපි අත්දැකීමෙන්ම දන්න දෙයක්.

ඉතිං මේ සංශෝධනයට ඉඩ දුන්නොත් වෙන්නේ අවුරුදු පනහක් හැටක් වැඩ කරලා වැඩ කරලා, දෑතේ දෙපයේ වාරු නැති වැඩිමහළු වයසට ආවාට පසුව අඩුම තරමින් බෙහෙත් ටිකක් ගන්නවත් තිබිය යුතු අර්ථසාධක අරමුදලේ හා භාරකාර අරමුදලේ ප්‍රතිලාභ සේවකයන්ට නොලැබී යාමයි. ඒ නිසා මේ සංශෝධනය කෙසේ හෝ පරාජය කර තමන්ගේ ජීවිතවල සැඳෑසමයේ සුරක්ෂිතභාවය වෙනුවෙන් සියලුම පෞද්ගලික අංශයේ සේවකයන් එක් විය යුතුයි.

දේශපාලන කවිදිය

# නරකාදියට යන පාර දිගේ...



## ව්‍යවස්ථාවට සංශෝධනයක්!

අගෝස්තු මාසය ගෙවී ගියේ ප්‍රජාතන්ත්‍රවාදය, රාජ්‍යයේ කොටස් අතර සංවරණය තුලනය, අධිකරණයේ ස්වාධීනත්වය ආදී විවිධ මාතෘකා පිළිබඳ සංවාදය උණුසුම් වෙමිනි. ඊට හේතුව වුයේ අගෝස්තු මස 18 වැනිදා ආණ්ඩුව 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබීමය. එය අගෝස්තු මස 7 වැනිදා ගැසට් කර තිබිණි. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 65 සිට 67 දක්වා ඉහළ නැංවීම සහ අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 63 සිට 65 දක්වා ඉහළ නැංවීම එමගින් යෝජනා වී තිබිණි. බලයට පත්වී වසරක් තුළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම ආරම්භ කරන බවටත්, පවතින ව්‍යවස්ථාවට කඩිනමින් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ගෙන එන බවටත්, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවටත් පොරොන්දු වූ ආණ්ඩුව හිටි අඩියේ ජේ ආර්ගේ බහුභූත ව්‍යවස්ථාවට" අණ්ඩ දැමීමට තීරණය කළේ මන්ද?

මෙම ව්‍යවස්ථා සංශෝධනය සඳහා හේතුව විමසූ විට ආණ්ඩුවේ නියෝජිතයන් නඩු ප්‍රමාදය වැළැක්වීම, හොරු ඇල්ලීමට පහසුවීම, ජ්‍යෙෂ්ඨ විනිසුරුවනගේ අත්දැකීම්වලින් ප්‍රයෝජන ගැනීම වැනි විවිධාකාර හේතු දක්වයි. නමුත් එම හේතු සියල්ලම ව්‍යාජ හේතු බව මේ වනවිට නොදන්නා කෙනෙක් නැත. මෙම උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස ඉහළ නැංවීම සහ සොරකම්වලට දඬුවම් දීම අතර සම්බන්ධයක් නැත. වංචා දූෂණ නඩු විභාග වන්නේ මහාධිකරණවල සහ මහේස්ත්‍රාත් අධිකරණවල මිස ශ්‍රේෂ්ඨාධිකරණයේ නොවේ. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දූෂිතයන්ට දඬුවම් දීමට බලපාන්නේ නැත. අනෙක් අතට නඩු ප්‍රමාදයවැළැක්වීමට නම් ධාරිතාව වැඩි කළ යුත්තේත් මහේස්ත්‍රාත් අධිකරණ, දිසා අධිකරණ, මහාධිකරණ ආදියේ බවද කවුරුත් දන්නා කරුණකි. ගොඩගැසී ඇති නඩුවලින් 99%ක්ම තිබෙන්නේ එම අධිකරණවලය. එමෙන්ම නඩු ප්‍රමාදය වැළැක්වීමේ සැබෑ අරමුණක් ආණ්ඩුවට තිබෙනම් නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයන් වැළැක්වීම, අධිකරණ පද්ධතිය පුළුල් කිරීම, කාර්ය මණ්ඩල හිඟය පියවීම වැනි පියවර ගත හැක. මෙවැනි තර්ක ඉදිරිපත් වෙද්දී ආණ්ඩුව කියන්නේ 22 සංශෝධනය එක පියවරක් පමණක් වන අතර තවත් බොහෝ ක්‍රියාමාර්ග තිබෙන බවය. නමුත් බළලා මල්ලෙන් එළියට එන්නේ ඔය කියන ක්‍රියාමාර්ගවලින් ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය වෙන්නේ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයසට අදාළව පමණක් බව සිහිපත් වන විටය. ඉතිරි හැම ක්‍රියාමාර්ගයක්ම අයවැයෙන් මුදල් වෙන් කිරීම හරහා සහ අධිකරණ සේවා පනත සංශෝධනය කිරීම ඇතුළු සරල පියවර හරහා ඉටු කරගත හැක. ඒ කිසිවක් කරන හදිසියක් නැතිව මෙපමණ විවාදාත්මක ක්‍රියාමාර්ගයකට මෙතරම් හදිසියක් ආණ්ඩුවට ඇත්තේ ඇයි?

ඇත්ත හේතුව ආණ්ඩුවේ ඉදිරි ජනතා විරෝධී ක්‍රියාමාර්ග සඳහා මාර්ගය හෙළිපෙහෙළි කිරීමක් සිදු කිරීමේ අවශ්‍යතාව බව ඕනෑම කෙනෙකුට පැහැදිලිව පෙනේ. ආණ්ඩුව ඉතිහාස කාලයක් පුරා කම්කරුවන් අරගල කර දිනාගත් කම්කරු අයිතිවාසිකම් අහෝසි කරන තනි කම්කරු නීතිය නම් නව පනතක් ගෙන ඒමේ සූදානමක සිටී. සේවක අර්ථසාධක අරමුදලේ පාලනයට ධනකුවේර ජාවාරම්කරුවන් හවුල් කර ගැනීමේ අවස්ථාව නිර්මාණය කරන නීති සංශෝධනයකට සූදානම් වේ. කම්කරුවන්ගේ සාමූහිකව කේවල් කිරීමේ අයිතිය අහිමි කරන ආයෝජන ආරක්ෂණ පනතක් ලියැවෙමින් තිබේ. එම නව නීතිවලට එරෙහිව කම්කරුවන් ගන්නා නෛතික ක්‍රියාමාර්ග මෙන්ම උද්ඝෝෂණ ක්‍රියාමාර්ගත් පාලනය කර ගැනීමට ආණ්ඩුවට මර්දනයේ දත් සහ නිය මුවහත් කර ගැනීමේ අවශ්‍යතාවක් ඇත. ගොවි ඉඩම් සමාගම් සතු කිරීමේ දිගුකාලීන අරමුණ ඇතිව ගොවි සමූපකාර වෙනුවට ගොවි සමාගම් ව්‍යූහයක් නිර්මාණය කිරීමටත්, වී අලෙවි මණ්ඩලය පෞද්ගලීකරණය කිරීමටත් ආණ්ඩුව සැලසුම් කරමින් සිටී. එම සැලසුම සාර්ථක කර ගැනීමට නම් ගොවීන්ගේ නෛතික ක්‍රියාමාර්ග සහ උද්ඝෝෂණ ක්‍රියාමාර්ග පාලනය කර ගත යුතුය. සාගරය කොටස්වලට බෙදා මත්ස්‍ය සම්පත පිරුණු කොටස් බහුජාතික සමාගම්වලට බදු දීමට සහ ධීවරයන්ට මහමුහුද අහිමි කිරීමට නව ධීවර පනතක් ළඟ ළඟම එමින් තිබේ. එයට ඇති ලොකුම බාධාව ධීවරයන් වන නිසා ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වයට තිරිංග යෙදිය යුතුයැයි ආණ්ඩුව කල්පනා කරයි. උපාධි කඩවලට රාජ්‍ය පිළිගැනීම සහ නෛතිකභාවය ලබාදෙන තත්ව නියාමනයේ හා ප්‍රතීතනයේ කොමිෂන් සභා පනතක් සකස් වෙමින් ඇත. දරුවන්ට අධ්‍යාපනයේ මූලික අයිතිවාසිකම අහිමි කරන ලෙස පාසල් තුන්දහසක් වසා දැමීමේ වැඩපිළිවෙළක් දියත් වන අතර පෞද්ගලික පාසල් නීතිගත කෙරෙන සේ පාසල් අධ්‍යාපන පනත සංශෝධනය කිරීමට රජයේ අවධානය යොමුව ඇත. එය යථාර්ථයක් කිරීමට නම් රාජ්‍යයේ හැම කුළුනක්ම ආණ්ඩුවේ පාලනය යටතට ගත යුතුය. සුළු මධ්‍ය පරිමාණ දේශීය නිෂ්පාදනයට ලබාදී ඇති රාජ්‍ය ආරක්ෂණය ඉවත් කරන නිදහස් වෙළෙඳ ගිවිසුම් දුසිමකට වැඩි ගණනක් සඳහා සාකච්ඡා ආරම්භ වී තිබේ. එවැන්නකට එන ජනතා විරෝධය පාගා දැමීමට පලක පන්තියට අධිකරණය තම පාලනයට ගත යුතුය. තවත් මෙවැනි දිග ලැයිස්තුවක් ඇත. රෝහල් රසායනාගාර සේවා පෞද්ගලීකරණය කිරීම, රාජ්‍ය ආයතන ඇවර කිරීම සහ විකිණීම, පී.එස්.ටී.ඒ. වැනි නව මර්දන නීති කරළියට ගෙන ඒම, ජනතාවගේ පොදු අරමුදල් උදුරා ගන්නා නව සමූපකාර පනත ආදී නව ලිබරල් ආක්‍රමණයේ පියවර හා ප්‍රහාර පිටුවක් පිරෙන්නට ලිවිය හැක. ව්‍යවස්ථා සංශෝධනයේ අරමුණ නව ලිබරල් පාරේ වේගයෙන් ගමන් කිරීමට අවශ්‍ය අත්තනෝමතික බලය විධායකය අතට ගැනීම බව වටහා ගැනීමට අතිශය ගැඹුරු බුද්ධියක් අවශ්‍ය නොවේ.

## රොනී පීරිස්ගේ සහතිකය සහ ජනතාවගේ අතෘප්තිය

ජාතික ජන බලවේග ආණ්ඩුවත් ගමන් කරන්නේ මීට පෙර අනෙක් දක්ෂිණාංශික ආණ්ඩු තට්ටු මාරුවට ගමන් කළ නරකාදිය වෙතට වැටී ඇති මාර්ග යේය. අගෝස්තු 11 වැනිදා ඩේලි එෆ්. ටී. පුවත්පතට ලිපියක් ලියන චන්ද්‍රිකාගේ පාලනයේ නව ලිබරල් කෙවට්ටයෙකු වූ හා වෝටර්ස් එජ් ගනුදෙනුවේදී දූෂණ චෝදනාවට ලක්වූ රොනී පීරිස් පවසන්නේ සිය පූර්වගාමී ආණ්ඩු අත තැබීමට පවා බියවූ නව ලිබරල් ප්‍රතිසංස්කරණ මේ ආණ්ඩුව නිර්භීත ලෙස සහ ධෛර්ය සම්පන්නව වේගයෙන් ක්‍රියාත්මක කරමින් යන බවය. මීට පෙර පැවතුණු ආණ්ඩුවලට එම නව ලිබරල් මාර්ගයේ වේගයෙන් යාම අපහසු වුයේ ජනතා බලවේග සිය ශක්තිය යොදවා එයට මාර්ග බාධක යොදා තිබුණු බැවිනි. ජනතාව උද්ඝෝෂණික පෙරමුණේ මෙන්ම සිය මූලික අයිතිවාසිකම් පිළිබඳ නියෝග ලබා ගැනීමට සහ නව පනත් කෙටුම්පත් පිළිබඳ ව්‍යවස්ථාමය අර්ථ නිරූපණ ලබා ගැනීමට නෛතික පෙරමුණේත් එම මාර්ග බාධක යෙදීමට ක්‍රියා කළ නිසාය. ආණ්ඩුව නව ලිබරල් පාරේ යන්නනම් මුලින් පාර සුද්ද කර ගත යුතු බව ඔවුන්ට වැටහේ. 22වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනු නව ලිබරල් අපායට යන මාර්ගය බාධක ඉවත් කර සුද්ද කරන ශ්‍රමදානයයි. එම ශ්‍රමදානය නම් කර තිබෙන්නේ වල්පැල ගලවා මල්පැල සිටුවන ශ්‍රමදානය නමින් වුවාට ඇත්ත අරමුණ වන්නේ අපව වේගයෙන් අපායට දක්කාගෙන යාමයි. 22 වන ව්‍යවස්ථා සංශෝධනය හුදු අධිකරණ ස්වාධීනත්වයට අත තැබීමෙන් ඔබ්බට ගොස් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නයක් සහ රට ගමන් කරන දේශපාලන - ආර්ථික ගමන්මගේ ප්‍රතිගාමීත්වය පිළිබඳ ප්‍රශ්නයක් වන්නේ එහෙයිනි.

මේ මාර්ගයේ ආණ්ඩුව ගමන් කරන විට එය පොහොසතුන්ට දිව්‍ය ලෝකයක් සහ දුප්පතුන්ට අපායක් නිර්මාණය කර දෙන බව නොතේරෙන කෙනෙකු නැත. රොනී පීරිස් වැනි ජාවාරම්කාර ධනපතියන් මේ පාර නිවැරදිම පාර බව කියන විට වැඩකරන ජනතාව කියන්නේ කුමක්ද? මේ සඳහා අපට හොඳම නිදසුනක් සපයන්නේ අගෝස්තු මාසයේම නිකුත් වූ වෙරිටේ රිසර්ච් වාර්තාවයි. 2011 ජුලි 11 සිට 30 දින දක්වා අහඹු ලෙස තෝරාගත් පුද්ගලයන් 2031 දෙනෙකු දැක්වූ අදහස් සමස්ත මතයකට ප්‍රක්ෂේපණය කර එම ආයතනය නිකුත් කළ සමීක්ෂණ වාර්තාවට අනුව ආර්ථිකයේ තත්වය ගැන ජනතාව සිටින්නේ අතෘප්තියෙනි. ජුලි මාසයේ සමීක්ෂණ වාර්තාව මාර්තු මාසයේ එම ආයතනයේම සමීක්ෂණ වාර්තාව සමග සංසන්දනය කරන විට අපට මේ පිළිබඳ චිත්‍රයක් මවාගත හැක. මාර්තු මාසයේදී ආණ්ඩුව කටයුතු කරන ආකාරය නිවැරදි බවට විශ්වාස කළ 65%ක ප්‍රතිශතය ජුලි මාසයේදී 51% දක්වා පහත වැටී ඇත. ආර්ථිකය ස්ථාවර වෙමින් හා තත්වය හොඳ අතට හැරෙමින් තිබෙන බව විශ්වාස කරන ප්‍රතිශතය මාර්තු මාසයේදී 64%ක සිට ජුලි මාසයේදී 42% දක්වා පහත වැටී තිබේ. එම සමීක්ෂණයට අනුව වර්තමානයේ ආර්ථිකයේ තත්වය හොඳ බව පැවසූ ප්‍රතිශතය එම කාලය තුළ 57% සිට 38% දක්වා පහත වැටී ඇත. විශේෂත්වය වනුයේ ජනතාවගෙන් 56%ක්ම රටේ ආර්ථිකය කඩා වැටුණු තත්වයක සහ අතිශය අවදානම් තත්වයක පවතින බව පවසා තිබීමයි. මාර්තු මාසයේදී මෙම ආර්ථික ගමන්මග ගැන තෘප්තිමත්දැයි අසද්දී 'ඔව්' කියූ 59%ක ප්‍රතිශතය ජුලි මාසයේදී 38% දක්වා පහත වැටී තිබේ. වෙරිටේ රිසර්ච් සමීක්ෂණයට අනුව රටේ ජනගහනයෙන් 62%ක් සිටින්නේ මෙම නව ලිබරල් ආර්ථික උපායමාර්ගය ගැන, ආර්ථිකය ගමන් කරන මාවත ගැන අතෘප්තියෙනි.

ආණ්ඩුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පවා සංශෝධනය කරමින් වේගයෙන් ගමන් කිරීමට සිතන්නේ එලෙස ජනතාවගෙන් තුනෙන් දෙකක් පමණ එරෙහි වන මාර්ග යකය. අගෝස්තු මාසයේදී අධිකරණයට බලපෑම් කරන ව්‍යවස්ථා සංශෝධනයක් සභාගත කරන්නේත්, සැප්තැම්බර් මාසයේදී රාජ්‍යය ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කිරීමේ පනත නම් අතිශය මර්දනකාරී පනත සභාගත කිරීමට සැලසුම් කර ඇත්තේත් මෙම "තුනෙන් දෙකේ අතෘප්තියට" පාර්ලිමේන්තුව තුළ ඇති "තුනෙන් දෙකේ බලය" භාවිතා කර මුහුණ දීමටය. එළඹෙමින් තිබෙන්නේ පාර්ලිමේන්තුව තුළ බලය සහ පාර්ලිමේන්තුවෙන් එළියේ බලය එකිනෙක මුහුණට මුහුණ අභිමුඛ වන වකවානුවකි. ඒ ද්වන්ධව සටනේදී අප සිටිය යුත්තේ කුමණ පැත්තේදැයි විවාදයක් තිබිය නොහැකිය.






# දුප්පතාගේ බත් පතට බදු ගහන
# ජඩ බදු ප්‍රතිපත්තිය

ප්‍රසුගියදා ලංකාවේ වාර්ෂික ඒක පුද්ගල ආදායම එක්සත් ජනපද ඩොලර් පන්දාහක් පසුකළා යන්නේ වාර්ෂික ඒක පුද්ගල ආදායම රුපියල් ලක්ෂ පහළොවක් පමණ වෙනවා මේක ලංකාවේ ඉතිහාසයේ වැඩිම ඒක පුද්ගල ආදායම ලෙස සැලකෙනවා. ඒ සමගම නැවතත් ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක් ලෙස වර්ගීකරණයට ලක්ව තිබෙනවා 2018 වන විටත් ලංකාව තිබුණේ ඉහළ මැදි ආදායම් තත්වේ පසුව ලංකාව ආර්ථික බංකොලොත්භාවයට පත්වෙළා ඉන්න අනතුරුව නැවතත් ඉහළ මැදි ආදායම් ලබන තත්වයට පත්වෙළා තිබෙනවා නමුත් අපි තේරුම් ගන්න ඕන කරුණු දෙකක් මෙහි තියෙනවා වාර්ෂික ඒක පුද්ගල ආදායම යි ආර්ථික බංකොලොත් භාවයයි අතර එකට එක අනුපාතයේ සම්බන්ධයක් නැහැ. කියන එක උදාහරණයක් විදිහට කිව්වොත් දැනටත් ලංකාව තියෙන්නේ ණය ගෙවා ගන්න බැරි මට්ටමේ ඒ කියන්නේ ඒක පුද්ගල ආදායම ඩොලර් පන්දාහ පසු කළාට ලංකාව තවම ආර්ථික බංකොලොත් භාවයෙන් පූර්ණ වශයෙන් අත්මිදිලා නැහැ කියන එක. මෙහි සරල අදහස තමයි රුපියල්වලින් කොච්චර පොහොසත් වුණත් නැතත් වැඩක් නැහැ කියන එක 27 මාර්තු වෙනකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කරගත් ගිවිසුම කල් ඉකුත් වෙනවා. තවමත් ලංකාවේ විදේශ විනිමය සංචිතය තියෙන්නේ බංකොලොත් භාවයෙන් මිදීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා පිටුපසින්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන විදිහට මේ වසරේ අග වන විට ලංකාවේ විදේශ විනිමය සංචිතය ඩොලර් බිලියන 8.6 ක ඉලක්කයක් කරා යා යුතුව තිබෙනවා. නමුත් දැනට තිබෙන විදේශ විනිමය සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6.45යි. ඒ කියන්නේ ඩොලර් බිලියන 2.15 ක් පිටුපසින් කියන එකයි. මාස හයක සුළු කාලයකින් ඒ ඉලක්කයට ළඟා වෙන්න බැරි බව ඉතා පැහැදිලියි. ඒ කියන්නේ ලංකාව තවමත් බංකොලොත් භාවයෙන් අත්මිදිලා නැහැ කියන එකයි.

## බරපතළ ආදායම් බෙදීයාමේ විෂමතාවයක්

දෙවන කාරණය ඊටත් වඩා බරපතළයි. අත්දැකීමෙන්ම අපි දන්නවා වාර්ෂික ඒක පුද්ගල ආදායම රුපියල් ලක්ෂ පහළොවක් ඉක්මවන්න පුළුවන් වෙලා තියෙන්නෙ රටේ ජනගහනයෙන් කීයෙන් කී දෙනාටද කියල කියන එක. තවත් පැහැදිලිව කියනවනම් මේ කියන ඒක පුද්ගල ආදායම ක් වාර්ෂිකව රුපියල් ලක්ෂ පහළොව, අද උපන් බිලින්දටත් අදාළයි. එහෙම බැලුවම ලංකාවේ සාමාන්‍යයෙන් හතර දෙනකුගෙන් යුතු පවුලක (ඇත්ත අගය 3.7) වාර්ෂික ආදායම ක් රුපියල් ලක්ෂ හැටක් විය යුතුයි. නමුත් මෙවැනි ආදායමක් තිබෙන පවුල් සංඛ්‍යාව කීයද? මේකෙන් පැහැදිලි වෙන්නේ ලංකාවේ ආදායම් බෙදී යාමේ විෂමතාව කොච්චර බරපතළ ද කියන එක.

මේ විෂමතාවය කියැවෙන තවත් පැතිකඩක් තමයි, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇති, කුටුම්භ ආදායම. එම දෙපාර්තමේන්තුව කියන විදියට ලංකාවේ සාමාන්‍ය පවුලක මාසික කුටුම්භ ආදායම රුපියල් 1,02,838 ක් වෙනවා. ඒ අර්ථයෙන් කුටුම්භයේ මාසික ඒක පුද්ගල ආදායම රුපියල් 27,793 ක් වෙනවා. නමුත් ලංකාවේ සාතිශය බහුතර පවුල්වල මාසික ආදායම රුපියල් 70,000 - 80,000 අතර හෝ ඊට පහළින් තිබෙන බව පැවසෙනවා.

නමුත් ජීවන වියදම පැත්තෙන් ගත්තොත් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියන විදියට කොළඹ තර දෙනකුගෙන් යුතු සාමාන්‍ය පවුලක මූලික අවම වියදම රුපියල් 74,000 ක් වෙනවා. මේ කියන මූලික අවම වියදම තේරුම් ගන්න නම් අපට ඉතිරි කැටගරිවලට යන්න වෙනවා. ඒ අනුව එම දෙපාර්තමේන්තුව කියන විදියට කොළඹ ගෙවල් කුලී ගෙවන්නේ නැතුව සාමාන්‍ය පහසුකම් සහිතව පවුලකට ජීවත් වෙන්න රුපියල් 4,47,000 සිට 5,71,000 ක් අතර මුදලක් අවශ්‍ය වෙනවා. සුවපහසු කුලී නිවසක ජීවත් වෙනවා නම් ඒ සඳහා ලැබිය යුතු කුටුම්භ මාසික ආදායම රුපියල් 6,50,000 ක් විය යුතු වෙනවා.

## නහුතෙට ඉහළ ගිය ජීවන වියදම

ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක් වෙද්දි සාමාන්‍ය මිනිහගේ ජීවන තත්වය කොහොමද කියලා පෙන්වන සංඛ්‍යාලේඛන ටිකකුත් පසුගිය දවස්වල සාකච්ඡාවට ආවා. ඒ අනුව 2018 වර්ෂයේදී, දරිද්‍රතා රේඛාවෙන් පහළ හිටපු ජනගහනය,11.5% සිට මේ වනවිට 22.5% දක්වා ඉහළ ගිහින් තිබෙනවා. එනම් දුප්පත්කම දෙගුණයකින් වැඩි වෙලා. ඒ අතර ආහාර අනාරක්ෂිත තාවයෙන් පෙළෙන ජනගහනය 11% සිට 33% දක්වා තුන් ගුණයකින් වැඩිවෙලා. අවුරුදු පහට අඩු ළමයින්ගෙන් සෑම පස් දෙනෙකුගෙන් එක්කෙනෙක් මන්දපෝෂණයෙන් පෙළෙනවා.2021 තිබූ 122.3%වූ ජීවන වියදම් දර්ශකය 222.3% දක්වා ඉහළ ගිහින් තියෙනවා. ඒ අනුව වැටුපේ ඇත්ත වටිනාකම 2021ට සාපේක්ෂව 22% න් පහළ ගිහින් තියෙනවා. මේක තමයි මේ වන විට ලංකාවේ ජනතාව මුහුණ දෙන ඇත්ත ජීවන තත්වය.

## IMF වට්ටෝරුව

දැන් අපි දන්නවා 2018 දිත් ලංකාව ඉහළ මැද ආදායම් ලබන රටක්. ඒ උනාට 202 - 22, වන විට ලංකාව බංකොලොත් භාවයට පත්වුණා. හිටි හිටි හැටියේ මේ විදියට ලංකාව බංකොලොත් භාවයට පත් වුණේ ඇයි?. මෙතැනදී තමන්ගේ ඒක පුද්ගල ආදායම දිහා බලලා ඉහළ මැද පන්තියේ අය ලංකාවේ ආර්ථිකය හොඳින් යනවා කියලා හිතන් හිටියට ඒක එහෙම වෙන්නේ නැති බව සිහි බුද්ධියෙන් තේරුම් ගත යුතු වෙනවා. ඒ කියන්නේ අප ඉහතිනුත් සඳහන් කර ඇති පරිදි ඒක පුද්ගල ආදායම වැඩිවීමයි, ආර්ථික බංකොලොත් භාවයයි අතර ඍජු එකට එක අනුපාතයේ සම්බන්ධයක් නැහැ. ඒ කියන්නේ ඒක පුද්ගල ආදායම වැඩි වෙද්දිත් රට බංකොලොත් වෙන්න පුළුවන් කියන එක.2022 ආර්ථික බංකොලොත් භාවයේ පැති දෙකක් තිබුණා. එකක් තමයි රාජ්‍ය සේවකයන්ගේ පඩි නඩි ගෙවාගන්න බැරි ගාණනට රාජ්‍ය භාණ්ඩාගාරය හිස් වෙලා තිබුණා. ඒකට බලපාපු එක හේතුවක් තමයි ඒක පුද්ගල ආදායම වැඩිවෙද්දි ඉහළ ආදායම් ලබන අයගෙන් බදු අය කරගන්න ප්‍රතිපත්තියක් සහ වැඩපිළිවෙළක් නොතිබුණු එක. රට බංකොලොත් භාවයේ ළඟ ප්‍රකාශනය තමයි රටට අවශ්‍ය ඛනිජ තෙල්, ඖෂධ, වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ පවා ආනයනය කරන්න ඩොලර් නැතිකම. මේ නිසා ආනයන සීමා කිරීමේ සිට ණය ගෙවීම අත්හිටුවීම දක්වා ක්‍රියාමාර්ග ගන්න සිදුවුණා. ඒ කියන්නේ බංකොලොත් භාවය ප්‍රකාශයට පත් කරන්න සිදුවුණා කියන එක. ආසන්න වශයෙන් අපි දන්නවා මේ විදියට ණය බර ඉහළ යන්නත්, ආනයන වියදම් ඉහළ යන්නත් හේතු වෙලා තියෙන්නේ මොකක්ද කියන එක. ඒක පුද්ගල ආදායම ටික දෙනකුගේ ඉහළ යද්දි ඔවුන්ගේ පාරිභෝජනයට අවශ්‍ය සුපිරි පහසුකම් සපයන්න තමයි මේ විදියට ලංකාවෙ ණය බර ඉහළ ගියේ කියන එක. ඒ විතරක් නෙවෙයි ආනයන වියදම් ඉහළ ගිහින් තියෙන්නෙත් ඒ අයට අවශ්‍ය සුපිරි පාරිභෝජන භාණ්ඩ ආනයනය කරන්න යාමෙන් කියන එක. උදාහරණවලින් කිව්වොත් අධිවේගී මාර්ග ඉදි කිරීම, නෙළුම් කුළුණ. ඉදිකිරීම වැනි ව්‍යාපෘතිවලට ණය ගැනීම වගේම, සුපිරි වාහන ආනයනය ඇතුළු බොහෝ කාරණා පෙන්වා දෙන්න පුළුවන්. මේ නිසා ලංකාවේ ආර්ථික අර්බුදයේ

විදේශ විනිමය සංචිත හිඟය පිළිබඳ අර්බුදයට ඉහළ ණය බර වගේම ආනයන වියදම් ඉහළ යාම බලපාලා තිබෙන බව ඉතා පැහැදිලි කරුණක්.

2022 ආර්ථික අර්බුදයේ පැහැදිලි හේතුව තමයි එතෙක් ආණ්ඩු අනුගමනය කළ ආර්ථික උපාය මාර්ගය සහ බදු ප්‍රතිපත්තිය අර්බුදයෙන් පස්සේ නැවතත් රට රැගෙන ගියේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දිශාවට. මේක හරියට හොරාගේ අම්මගෙන් පේන අහනවා වගේ වැඩක්. ඒගොල්ල දුන්නා අවුරුදු හතරකට බෙහෙත් වට්ටෝරුවක්. අවාසනාවකට ඒකෙන් එක ගුලියක් වත් තිබුණෙ නෑ විදේශ විනිමය වැඩි කරගන්න. එහෙම නැත්නම් විදේශ විනිමය සංචිතය කඩා වැටීම පිළිබඳ අර්බුදයට කිසිම විසඳුමක් ඉදිරිපත් කළේ නෑ. ඒ නිසා තවමත් ඒ අර්බුදය එහෙමම තියෙනවා. නමුත් රුපියල පිළිබඳ අර්බුදය එහෙම නැත්නම් රාජ්‍ය ආදායම් ප්‍රමාණවත් නොවීම පිළිබඳ අර්බුදය ගොඩ ගිහින් තියනවා. ආණ්ඩුව කියන විදිහටත් මහා භාණ්ඩාගාරය රුපියල් ආදායම්වලින් පිරී ඉතිරී ගිහින්. ඒක උනේ කොහොමද? ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කිව්වා බදු ආදායම වැඩි කරගන්න බදු දැල පුළුල් කරන්න කියලා. එවකට බලයේ හිටපු රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුව ඒක සුපිරියටම ආරම්භ කළා. කන බත්වේලටත් බදු ගහනවා කියලා ඒක විවේචනය කරපු අනුර කුමාරගේ ආණ්ඩුවත් ඒ ප්‍රතිපත්තිය එහෙමම කරගහගෙන යනවා ඒක සිද්ධ වුනේ මෙහෙමයි.VAT බද්ද 15% සිට 18% දක්වා වැඩි කලා. ඒ විතරක් නෙවෙයි වැට් බද්ද අදාළ වෙන භාණ්ඩ හා සේවාවල පරාසය 98% දක්වා ඉහළ දැම්ම. මේ නිසා එතෙක් වැට් බද්දෙන් නිදහස් කරලා තිබුණු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, සෞඛ්‍ය උපකරණ, පාසල් උපකරණ , වැනි බොහෝ භාණ්ඩ හා සේවා වැට් බද්දට අදාළ වුණා. මේ නිසා දේශීය නිෂ්පාදනය කරන කාන්තා සනීපාරක්ෂක තුවාවලින් පවා 18% ක වැට් බද්දක් අය කරනවා. ආනයන එකි. සනීපාරක්ෂක තුවාවලට මේ ගාණන ඊට වැඩියි. එහි බදු ප්‍රතිශතය 51% ක්. සාමාන්‍ය ජනතාව ගෙවන්නේ වැට් බද්ද විතරක් නෙවෙයි. ඉන්ධන, දුරකථන සහ අන්තර්ජාල සේවා, දුම් වැටි, මත්පැන්, ආදී භාණ්ඩ හා සේවාවලට අදාළ බදු ප්‍රතිශතය මීට වැඩියි. මේ සඳහා අතිරේක බදු පනවා තිබෙනවා. මේ විදියට බැලුවම සාමාන්‍ය වැඩ කරන ජනතාව තමන්ගේ වැටුපෙන් එහෙම නැත්නම් තමන්ගේ වියදමෙන් 25% පමණ ආණ්ඩුවට බදු ගෙවනවා.

මේ විදියට ආණ්ඩුව සාමාන්‍ය ජනතාවගෙන් අයකර ගන්න වක්‍ර බදු ඉහළ දැම්මට ධනපතියන් ගෙන් අයකර ගන්නා ඍජු බදු ඉහළ දැම්මේ නෑ. සාමාන්‍ය සමාගම්වලින්, එහෙම නැත්නම් ව්‍යාපාරවලින්, ලාභය මත අය කරගන්න බද්ද තවමත් තියෙන්නේ 30% සීමාවේ. පාර අතු ගාන සනීපාරක්ෂක කම්කරුවාගේ සිට දවස කුලියට වැඩට යන කම්කරුවා දක්වා ත්, රාජ්‍ය හෝ පෞද්ගලික සේවයේ නිරත, මාසික වැටුප් ලබන සාතිශය බහුතර කම්කරුවන් තමන්ගේ වැටුප වැය කරන්නේ මොනවටද? කන්න 08 වන පිටුවට..

# වී-සහල් නිෂ්පාදනයේ සැබෑ ගැටලුව හා විකල්පය



ලොව පුරා වෙසෙන කෝටි 300 ක් පමණ වන සුළු හා මධ්‍ය පරිමාණ ගොවීන් ලෝක ආහාර නිෂ්පාදනයෙන් 60% කට වග කියනවා. බහු ජාතික සමාගම් හිමියන්ට මේක බරපතළ හිසරදයක්, මෙයින් තමන්ට අත්පත් කර ගත හැකි ලාභ පංගුව , කෙසේ හෝ අත්පත් කර ගැනීම, ඔවුන්ගේ ඉලක්කයයි.

ඒ ඉලක්කය සපුරා ගැනීම සදහා සම්ප්‍රදායික කෘෂි සංස්කෘතිය මුළුමනින් ම විනාශ කරලීම එහි අනිවාර්යය ඉලක්කයකි. සාම්ප්‍රදායික කෘෂි සංස්කෘතියේ යහපත් ලක්ෂණ වැඩි දියුණු කරමින්, නොගැලපෙන ලක්ෂණ ඉවත් කරමින්, එය වැඩි දියුණු කරනවා, වෙනුවට, සැලසුම් සහගත ව බහු ජාතික සමාගම් කෘෂි ක්ෂේත්‍රයේ ඒකාධිකාරය අත්පත් කර ගැනීම සදහා මහා පරිමාණ ඒක බෝග වගාවන්, වඳ බීජ, මරා ගෙන මැරෙන බීජ හරහා සුළු හා මධ්‍ය පරිමාණ ගොවීන් ගොවි බිම්වලින් පලවා හරිමින් සිටිනවා.

ලංකාවේ දී එම ධනේශ්වර වැඩපිළිවෙළ අපට හමු වන්නේ කෙසේ ද ?

1995 ජුලි 17 අංක 14546-CE යටතේ 'ශ්‍රී ලංකාවේ වැවිලි බෝගවලට අයත් නොවන, කෘෂි ක්ෂේත්‍රයෙහි ප්‍රතිපත්තිමය විකල්පයක් පිළිබඳ ලෝක බැංකු වාර්තාව' හරහා

01 සියලු ජනපදවල ගොවීන්ට සින්නක්කර ඔප්පු ලබාදී, රජය මැදිහත් වී ඉඩම් පිළිබඳ නිදහස් වෙළෙඳපොළක් ඇති කළ යුතු බවට නිර්දේශ කරයි.

02 සියලු වාරි ජල සැපයුම් විකිණිය හැකි පරිදි, පෞද්ගලික අංශයට පැවරීමට නිර්දේශ කරයි.

03 කෘෂිකාර්මික වෙළෙඳ කටයුතු වලින් මුළු මනින් ම රජය ඉවත් විය යුතු බවට ද නිර්දේශ කරයි.

මෙහි ම දිගුවක් ලෙස වර්ෂ 2000 දී 'බිම් සවිය' ඔප්පු බෙදා දීමේ වැඩ සටහන ආරම්භ වන්නේ.

2002 දී ලෝක බැංකුව තවත් සැලස්මක් 'ශ්‍රී ලංකාවේ දිළිඳුබව තුරන් කිරීමේ උපායමාර්ය හා වර්ධනය සම්බන්ධ කිරීම' යනුවෙන් රැගෙන එනවා. ඒ අනුව 2003 'යළි පුබුදමු ශ්‍රී ලංකා'(Regaining Sri Lanka) හරහා ලංකාවේ ඉඩම්වලට වාණිජ වටිනාකමක් ලබා දීමට හා කෘෂි ඉඩම් මහා පරිමාණ සමාගම්වලට ලබා දීමට උත්සහ කළා.

2013 දී බීජ හා රෝපණ ද්‍රව්‍ය පනත රැගෙන එමින් ගොවීන් සතු බීජ නිෂ්පාදනය කිරීමේ අයිතිය මුළු මනින් ම අහිමි කර, බහු ජාතික සහාගම්වලට එම අයිතිය නිත්‍යානුකූලව පැවැරීම සිදු කර තිබෙනවා.

2017 මාර්තු 16 වන දින නිකුත් කරන ලද ගැසට් පත්‍රය මගින් මෙරට භූගත හා මතුපිට ජලය පරිහරණය කිරීමේ දී මිලක් අය කර ගත යුතු බවට දැනටමත් නීති සම්පාදනය කර ගෙන තිබෙනවා.

ඉහත තොරතුරු මෙම ලිපිය ආරම්භ කිරීමට පෙරාතු ව ඉදිරි පත් කරනු ලැබුවේ, ලංකාවේ වී - සහල් නිෂ්පාදනයේ ඇත්ත ගැටලුව හඳුනාගැනීමට නම්, ලංකාවේ ධනපති පන්තිය හා එහි නියෝජිත ආයතනය වන ධනපති ආණ්ඩුවල කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ දිශානතිය පිළිබඳ දළ අදහසක් හෝ නොමැතිව ඒ පිළිබඳ ව කතා කිරීම නිෂ්ඵල වන බැවිනි.

මෙතෙක් පැවැති ආණ්ඩුත්, පවතින ජාතික ජන බලවේග ආණ්ඩුවත්, අනුගමනය කරන කෘෂිකාර්මික ප්‍රතිපත්තිය, ඉහතින් කතා කළ ලෝක බැංකු නිර්දේශ මත කටයුතු කරන ප්‍රතිපත්තිය බවට කිසිදු සැකයක් දැන් කිසිවෙකුට තිබිය නොහැක. කෘෂිකර්ම ඇමැති ලාල් කාන්තගේ "ගොවීන්ගේ ඉඩම් එක්කර ගොවි සමාගම් හදනවා, ගොවීන් Director Board එකට, ලාභ ලබන්නේ දාන Shares ගාණට", යන ප්‍රකාශය හුදු ඔහුගේ කට මැද දෙඩිල්ලක් නොවේ ,මේවා ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කෘෂිකර්මාන්තය සමාග මිකරණ වැඩපිළිවෙළ හා සම්බන්ධය.

ලාල් කාන්තලාට 'ගොවි ඉඩම් එක්කර ගොවි සමාගම් හදනවා' යන ගොවියා ගොවිතැනෙන් පන්නන බියකරු ප්‍රකාශයක් නොබිය ව කියන්නට තරම්, ධනපති වැඩපිළිවෙළ දැන් ගොවීන් අතරත් පත්තියම් වෙලා.

කෘෂි කර්මාන්තයේ මූලික සාධක ඉඩම්, ජලය, බීජ, පොහොර, කෘෂි රසායන හා යන්ත්‍ර සූත්‍ර සියල්ල ම පාහේ දැන් ක්‍රමාණුකූලව සමාග මිකරණයට නතු වෙමින් පවතිනවා. අස්වනු මිළ තීරණය පවා දැන් ව්‍යාපාරිකයන් අතලොස්සක් අතට පත්වෙළා. ගොවියා සමාගම් වළල්ලක ගොදුරක් වෙලා.

1950 දශකයෙන් ආරම්භ වූ ලංකාවේ හරිත විප්ලවය හෙවත් කෘෂිකර්මාන්තය සඳහා පොහොර, කෘෂි රසායන භාවිතය, එමගින් අස්වැන්න වැඩිවීම 1940 දශකයේ හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 0.6 වූ ලංකාවේ වී අස්වැන්න වැඩිවීම, හරහා ගොවියාට ද හොරෙන් ගොවියා සමාගම්කාර උගුලට කොටුවීම, දශක හත අටක ඉතිහාසගත කතාවකි. ඒ හරහා නැවත සුවපත් කළ නොහැකි ලෙස පස නිසරුවීම, පානීය ජලය විෂවීම, වනාන්තර අහිමිවීම, වන සතුන්ට වාසස්ථාන අහිමිවීම ආදී වශයෙන් ඛේදවාචක ගොන්නකි. ඉතිහාසය එසේ වෙද් දී වර්තමානයේ ගොවියන් ප්‍රමිතියෙන් යුතු පොහොර, ප්‍රමිතියෙන් යුතු බීජ හා රසායන ද්‍රව්‍ය ලබා දෙන ලෙස ඉල්ලා කොම්පැනිකාරයන් ඉදිරියේ අයැද සිටීම දෛවයේ සරදමකි !

ඒ අනුව බලන විට ලංකාවේ මේ මොහොතේ අප අත්විදින වී අලෙවියේ, ගැටලුව යනු ධනවාදයේ ඓතිහාසික කාර්යභාරයේ කූටප්‍රාප්තියයි. දැන් ගොවියා බිත්තියට ම හේත්තු කර ඇත. මෙයට එරෙහිව ගොවියා සංවිධානාත්මක ව විකල්ප වැඩපිළිවෙළක් සහිතව නැගී නොසිටින්නේ නම්, ගොවියාගේත්, ගොවිතැනේත් අභාවය සනිටුහන් වනු ඇත.

වත්මන් වී- සහල් ගැටලුවේ සුලමුල කෙසේ ද ? 2025/26 මහ කන්නයේ වී අස්වැන්න මෙට්‍රික් ටොන් ලක්ෂ 28 ක්, ආණ්ඩුවේ බලධාරීන් කුණු කොල්ලයට වී නොවිකුණන ලෙස ගොවීන්ගෙන් දිගින් දිගට ම ඉල්ලා සිටීමේ ප්‍රතිඵලයක් ලෙස ගොවීන් ද සැලකිය යුතු ප්‍රමාණයක් නිවෙස්වල වී ගබඩා කර තබා ගත්තා. ඒ අතර ආණ්ඩුව පොන්නි සම්බා මෙට්‍රික් ටොන් 150000 ක් පමණ ආනයනය කරන්න පෞද්ගලික අංශයට ඉඩ හදා දුන්නා. ඒවා වෙළෙඳපොළේ කිලෝව රුපියල් 230 ට විකිණීමට තිබු නිසා නාඩු සහල් ඉල්ලුම පහළ වැටුණා.

2026 යල අස්වනු නෙලීම පටන් ගන්නා විටත් රජයේ ගබඩාවල වී කිලෝ මෙට්‍රික් ටොන් ලක්ෂ 02 ක් විතර තිබුණා. 2026 යළ තවත් අලුතින් වෙළෙඳපොළට වී කිලෝ මෙට්‍රික් ටොන් ලක්ෂ 10 විතර එමින් පවතිනවා. ලංකාවේ සමස්ත වී ගබඩාවල ධාරිතාව වී කිලෝ මෙට්‍රික් ටොන් ලක්ෂ 07 කි. රජයේ ගබඩාවල මේ වන විටත් මෙට්‍රික් ටොන් ලක්ෂ 02 ක් ඉතිරිව තිබීමත්, සුළු හා මධ්‍ය පරිමාණ සහල් ව්‍යාපාරිකයන් ගත් ණය ගෙවීමට නොහැකිව අර්බුදයක සිරවී සිටීමත්, මහ මෝල් හිමියන්ට දෛනික වෙළෙඳපොළ සහල් සැපයුමට අවශ්‍ය වී ගබඩාවල ප්‍රමාණවත් ව පැවතී ම නිසා වී මිල දී ගැනීම අවම කර තිබීමත්, නිසා රජය බරපතළ අර්බුදයක සිර වී සිටී.

දැන් රජයට ඉතිරි වී ඇති එක ම විකල්පය සුළු හා මධ්‍ය පරිමාණ සහල් ව්‍යාපාරිකයන්ට ණය මුදලක් ලබා දී ඔවුන් හරහා මේ අර්බුදයෙන් ගොඩ ඒම ය. ඒත් ඔවුන් ගෙන් බොහෝ ප්‍රමාණයක් ගත් ණය ගෙවා ගැනීමට නොහැකිව සිටින්නන් ය. කෙසේ හෝ ඔවුනට ණය ලබා දුන හොත් ඒවා අපසු අය කර ගැනීමේ අනතුරට ද රජය මුහුණ දිය යුතුය.

2025/26 මහ කන්නයට සාපේක්ෂව 2026 මහ කන්නයේ අක්කරයක් වගා කිරීමට යන වියදම රුපියල් 24,890 කින් ඉහළ ගොස් ඇති බව ගොවි ජාතික සමුළුව කියයි. ඉන්ධන හා පොහොර මිල ඉහළ යාම මෙයට ප්‍රධාන හේතුවයි. ඒ අනුව නාඩු වී කිලෝවක මිල රුපියල් 137 ක් විය යුතු බවට, කෘෂිකර්ම ඇමැතිවරයා පාර්ලිමේන්තුවේදී ද ප්‍රකාශ කර සිටියත්,

පසුව ඔහු ම ප්‍රකාශ කර සිටියේ, වී මිළ වැඩි කිරීම කෙසේ වෙතත් පවත්නා මිලටවත් සියලු වී මිල දී ගත නොහැකි බවයි.

2026 යල කන්නය පටන් ගන්නා විට ලංකාවේ වගා කරන සියලු බෝග සදහා අවශ්‍ය පොහොර ප්‍රමාණය (යූරියා මෙට්‍රික් ටොන් 125000 / TSP මෙට්‍රික් ටොන් 19000 /MOP මෙට්‍රික් ටොන් 42500) රට තුළ පැවැතුණි. එනමුදු මාර්තු මස එක් වරම පොහොර හිගයක් මවා පා මිළ ද ඉහළ ගියේ ය. එවිට ගොවි නියෝජිතයන් අමාත්‍යාංශ නිලධාරීන් හා සාකච්ඡා කොට, එවකට රට තුළ පැවති පොහොර තොග ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා මිළ දී ගෙන ගොවි සංවිධාන වෙත ලබා දීමට එකඟතාවක් ඇතිකර ගෙන ඇත. නමුත් පසුව පොහොර සමාගම් හිමියන් ජනාධිපතිවරයා හා කළ සාකච්ඡාවෙන් අනතුරුව යූරියා මෙට්‍රික් ටොන් 25,000 අතුරුදන්ව රුපියල් 9,500 ට රජයට ලබා දීමට සමාගම් එකග වූ යූරියා මිටිය වෙළෙඳපලෙන් රු. 12,500/- සිට රු. 18,000/- මිල ගණන්වලට ගොවියාට මිළ දී ගැනීමට සිදු විය.

> **2026 යළ අස්වනු නෙලීම පටන් ගන්නා විටත් රජයේ ගබඩාවල වී කිලෝ මෙට්‍රික් ටොන් ලක්ෂ 02 ක් විතර තිබුණා. 2026 යළ තවත් අලුතින් වෙළදපලට වී කිලෝ හෙට්‍රික් ටොන් ලක්ෂ 10 විතර එමින් පවතිනවා. ලංකාවේ සමස්ත වී ගබඩාවල ධාරිතාව වී කිලෝ මෙට්‍රික් ටොන් ලක්ෂ 07 කි.**

ඉහත තොරතුරු උඩින් පල්ලෙන් කියවන්නෙකුට වුව ඉතා ම පැහැදිලි වන්නේ, මෙය ජාතික ජනබලවේග ආණ්ඩුවේ පරිණත අපරිණතභාවය පිළිබඳ ප්‍රශ්නයක්වත්, උද්දච්ඡකම පිළිබඳ ප්‍රශ්නයක්වත් නොව ධනපති පන්ති පක්ෂපාතිත්වය හා කරපින්නා ගෙන යන ධනවාදී වැඩපිළිවෙළ පිළිබඳ ප්‍රශ්නයක් බවයි. එ බැවින් ඒ ස

සඳහා විසඳුම් සෙවිය යුත්තේ ද පන්ති පදනමක සිටය. එනම් නිර්ධන පන්තියට පක්ෂපාති දෘෂ්ටියක සිටය.

නමුත්, අපට ගොවි බිමේ දී හමුවනුයේ UNP, පොහොට්ටු, JVP, මුස්ලිම් කොන්ග්‍රස්, TNA ගොවියෙකි. එසේ නැතහොත් සිංහල, තමිල් හෝ මුස්ලිම් ගොවියෙකි. මේ සියල්ල 'අපි ගොවියෝ' යන සමූහ පරිකල්පනයට රැගෙන ඒම සැබෑ විසඳුමක් සඳහා පවතින තීරණාත්මක අභියෝගයකි. එය ජය ගැනීම සඳහා නිර්ධන පන්ති දෘෂ්ටිකින් හෙබි පළල් ගොවි බහුජන ව්‍යාපාරයක් ගොඩනැගීම, මූලික අවශ්‍යතාවකි. ඒ සඳහා ගොවීන් සිදු කරන වගාවට අනුරූපී සටන් (නිසි කලට පොහොර, වීවලට සාධාරණ මිලක්) හෙවත් සංසිද්ධික අරගල ඉක්ම වූ ගොවියා ගොවි බිමෙන් පන්නන IMF හා ලෝක බැංකු වැඩපිළිවෙළ පරදන ඊට එරෙහි අඛණ්ඩ මතවාදී, ආර්ථික හා දේශපාලන අරගලයකට පෙළ ගැස්වීම අනිවාර්ය ය.

ඒ සඳහා නව ලිබරල් ධනවාදී කෘෂි ප්‍රතිපත්තියට එරෙහි හුදු ආණ්ඩු පෙරළි, පුද්ගල විරෝධී පාර්ලිමේන්තු විපක්ෂයේ කඩාකප්පල්කාර බාග අරගල වෙනුවට පන්ති සවිඥානික, අභියෝගාත්මක ප්‍රති හෙජමොනික බලයක් ගොඩ නගමින්, ඒ හරහා කෙටි කාලීන හා දිගු කාලීන වැඩපිළිවෙළක් සහිත අරගලයක් සක්‍රීය කිරීම කළ යුතුය.

කෙටිකාලීන වැඩපිළිවෙළ යටතේ වී නිෂ්පාදන පිරියැය අඩු කර සහන මිලකට වෙළෙඳපොළට සහල් ලබා දීම කෙරෙහි අවධානය යොමු කරමින්, ආණ්ඩුව විසින් ගෙන යන සහනාධාර ඉල්ලීම, ගොවියාගේ පෞද්ගලික ගිණුමට බැර කර, ඔහුට අපහාස කිරීමේ දෘෂ්ටිවාදය පරදවමින්, ගොවියා ජාතික නිෂ්පාදනයට වී නිෂ්පාදනයෙන් දායක වන්නාගේ කාර්යය ඉස්මතු කර, සහනාධාර යනු ගොවියාගේ පෞද්ගලික ගිණුමකට බැර වන්නක් නොව, එය ජාතික නිෂ්පාදනයට කරන දායකත්වයකි, යන සැබෑ ආර්ථික අරමුණ තහවුරු කළ යුතුය. එනම් ගොවීන්ට පොහොර, ඉන්ධන හා වෙනත් සහනාධාර ලබාදීම යනු ජාතික ආර්ථික අවශ්‍යතාවකි. ඒ නිසා එය ඇමැති කියන විදිහට 'පිං පඩියක්' නොවේ.

දියුණු යැයි සම්මත අමරිකාව කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයට වාර්ෂිකව ඩොලර් බිලියන 20 කට අධික සෘජු සහනාධාර ලබා දෙන අතර ජර්මනිය, ප්‍රංශය වාර්ෂිකව ගොවීන්ට යුරෝ බිලියන 50 කට අධික රාජ්‍ය අධාර ලබා දෙයි. අසල්වැසි ඉන්දියාවේ ද පොහොර ඉන්ධන හා බලශක්ති සඳහා විශාල සහන ලබා දෙයි. ඉන්දියාවෙන් අනනය කර සහල් කිලෝව රු. 165 කට ලංකාවේ දී ලබා දීමේ, වෙන රොකට් සයන්ස් එකක් නැත. එහි ඇත්තේ ඉන්දියානු රජයේ සහනාධාර හරහා සහල් නිෂ්පාදන පිරිවැය අඩුවීමේ වාසියයි. ඉන්දියාවේ දී ගොවීන් ඒවා ලේ වැකි සටන් හරහා දිනා ගත්තේ බව ද අමතක නොකළ යුතුය.

ඊට අමතරව බීජ, පොහොර, කෘෂි රසායන හා අනෙකුත් යෙදවුම්වල ප්‍රමිතිය, සහන පොලියට ණය, රාජ්‍යයේ වි මිල දී ගැවීමේ පංගුව ඉහළ දා ගැනීම, රාජ්‍ය ගබඩා පුළුල් කර ගැනීම වෙනුවෙන් රජයට අඛණ්ඩව බලපෑම් කළ යුතුය.

නවීන කෘෂි තාක්ෂණය භාවිතයට හුරුවීම, නව බීජ කෙරෙහි අවධානය යොමු වීම, සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් හා එක්ව සහල් නිෂ්පාදනය සඳහා අවධානය යොමු කිරීම, කෙටි කාලීන අරමුණු ලෙස හඳුනා ගත හැකි ය.

කෘෂිකර්මාන්තයේ මූලික සාධක ලෙස ගැනෙන ඉඩම්, ජලය, බීජ සිය භාරයට ගැනීමටත්, කෘෂි ක්ෂේත්‍රයේ තීරණ ගැනීමේ බලය තමා සතු කර ගැනීමටත් ගොවීන් කරන අඛණ්ඩ සවිඥානක අරගලය දිගුකාලීන වැඩපිළිවෙළ හා බැඳී පවතී. එවැනි ප්‍රායෝගික වැඩපිළිවෙළක අඛණ්ඩ කොටස්කරුවන් වීමෙන් හැර ගොවීන්ට තම නිදහස අත් කර ගත නොහැක.
















## දූපතින් එළියට

නන්දා මාලනී දිවි සැරිය නිමා කරලා ගිහින් දැන් දවස් කීපයක්. එහෙත් ඇය හා සුනිල් ආරියරත්න පිළිබඳ කතිකාවන් සමාජයේ තාමත් වියැකී ගිහින් නෑ.

නන්දා මාලනී මීට දශක හතරකට පෙර ජීවත්ව සිටි පරම්පරාවකට කොපමණ බලපෑම් සහගත ගැහැනියක වුවාද කියන එක ඇය ඇයගේ මරණය විසින් යළි යළිත් සනාථ කර තිබෙනවා. ඒ බලපෑමෙන් මිදෙන්නෙ කිසිවෙකුටවත් හැකියාවක් නැහැ.

සමහරුන් කියල තිබුණා (අපගේ ඇතැම් හිතවතුන් පවා) ඇයගේ විරෝදාර ජීවිතය දශක දෙකකට පෙර අවසන් උනා කියලා.

නමුත් වීරෝදාරභාවයන් තනි පුද්ගලයෙක්ගේ ජීවිතය පිළිබඳ මැනීමක් ලෙස ගැනීම නිවැරදිත් නැහැ සාධාරණත් නැහැ. මන්ද යත් එය හැමවිටම සමාජ නිපැයුමක් සමග සම්බන්ධ වන නිසා.

සිය අතීත කැරැලිකාරීත්වයන් යල් පීනූ සමාජ පිළිවෙතක් ලෙස බැහැර කරලීමට ජනතා විමුක්ති පෙරමුණම කටයුතු කරද්දී නන්දා මාලනීලගේ ජීවිතවල තිබුණු ඒ රණකාමි බව සෙවීම නිශ්ඵල කටයුත්තක්. ජවිපෙ නග්න ජාතිවාදය හා සරණ යද්දී අප නන්දාගෙන් ජාත්‍යන්තර වාදය ඉල්ලා සිටීමම සාහසික විහිළුවක්.

එහෙත් ඒ අතරම මියගිය නන්දා මාලනිගෙ ජීවිතය හා සමාජ ව්‍යපාරයන්ගේ පීලි පැනීම් එකට ගෙන කළ යුතු වඩා හරවත් ගැඹුරු සංවාදයක් ඉතිරිව තිබෙනවා. එය කවුරුන් විසින් හෝ ඇරඹිය යුතුයි.

=====================================

ගෝල්ෆේස් අරගලය විසින් සැලකිය යුතු පමණකට යටපත් කර හරින ලද ජාතිවාදී මානසිකත්වයන් ෆෙස්බුක් සමාජ ජාලය හරහා යළි උත්කර්ෂයට නැංවීමට සංවිධානාත්මකව කටයුතු කරන පිරිසක් වෙර දරන බව දැක ගන්න ලැබෙනවා. මෙය ආරම්භ වුණේ ත්‍රිකුණාමලයේ පන්සලක මැදිහත්වීමෙන් අනවසරයෙන් බුදුපිළිම තැන්පත් කරන්න ගිය සිදුවීමත් සමග.

වසර 36කට පෙර තමන්ගෙන් බලහත්කාරයෙන් අත්පත් කර ගත් ඉඩම් යළි ඉල්ලලා ජනතාව සාමකාමී උද්ඝෝෂණ ව්‍යාපාර ආරම්භ කරන්න ගැනීමත් සමග දැන් මේ තත්වය තවත් වර්ධනය වෙලා.

උතුරේ පලෙයි පුදේශයේ ඝන කැලෑවක් තුළ එල්ටීටීඊ පුහුණු කඳවුරක් පවත්වාගෙන යන බවට ඊනියා බුද්ධි අංශ විසින් වාර්තා කළ බවට සඳහන් පුවත ලැව් ගින්නක් සේ රටපුරා පැතිර ගියා. එවැනි පුවතක් සිය සමාජ මාධ්‍ය හරහා බෙදා හැරි පුද්ගලයෙක්වත් අත්අඩංගුවට ගනු ලැබුවා. නමුත් මේ පිටිපස සිට මෙය මෙහෙයවන ලද ඊනියා බුද්ධි අංශ පිළිබඳව කිසිදු පරීක්ෂණයක් තාමත් සිදු කෙරෙන්නේ නැහැ.

හැමදාමත් පාලකයන්ට සිය පැවැත්ම වෙනුවෙන් සතුරෙක් අවශ්‍ය කර තිබුණා. 2009 යුද්ධය අවසන් වීමෙන් පස්සේ ඔවුන් ලොකු දේශපාලන අර්බුදයකට මුහුණ දුන්නා. වරෙක මුස්ලිම් ජනතාව සතුරෙක් ලෙස මවාපෑමට පාස්කු සිද්ධිය ඉවහල් කරත්තා.

යළිත් එල්ටීටීඊය හිස ඔසවමින් සිටින බවට කරන මේ ප්‍රකාශ පිටුපස ඇති මේ නග්න දේශපාලන උවමනාවන් සමාජය ඉතා ගැඹුරින් තේරුම් ගත යුතුව තිබෙනවා.

=====================================

"දන්නවද පාසලින් අස්වුනු ළමයි කරන වැඩ "...?

"මොනවද"

"බීලා සිංහල අයගේ කේන්තිය අවුස්සනවා. ෂර්ට් නැතුව දෙතුන්දෙනා හෙල්මට්වත් නැතුව පාර පුරා මෝටර් සයිකල්වල යනවා. සිංහල ගෙවල් ගාවදී හූ කියනවා "

"ඉතින් ඕන ජාතියක කොල්ලෝ ඔය වැඩේ කරනවානේ. ඕකට කියන්නේ ජාතිවාදය නෙවෙයි. මදාවිකම..."

මේ අපූරු සටහන එන්නෙ නිශ්ශංක විජේ මාන්නගේ ගෙ" සඳ පළුව තනි තරුව නවකතා පොතේ 164 වන පිටුවෙ. මේ සමාජයට ගැඹුරින් හිතන්න යමක් ඒ පුංචි කතාබහ තුළ සැඟවිලා තියෙනවා කියලා හිතුන නිසා එය "දූපතින් එළියට" තීරු ලිපියේ ලියා තබන්න හිතුවා

# තමන්ගෙ නඩු තමන්ම අහන




## පුනරුදේ අවනඩුව

ආණ්ඩුව අමුතුම තාලයේ අඩව්වක් අල්ලා ඇතග ඒ හිටි හැටියේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ වයස් සීමාව දික්කරන්න ගැනීමට ඔවුන් ගත් තීරණය යි. පාලකයන්ට හිතු මනාපේ එවැන්නක් කිරීමේ සාමාන්‍ය ක්‍රියා පටිපාටියක් නැත. වයස් සීමා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේම දක්වා ඇති බැවින් වයස් සීමා වෙනස කළ යුතු විධික්‍රමය වැටී ඇත්තේ ව්‍යවස්ථා සංශෝධනයක් මගිනි. 22 වන සංශෝධනය අප වෙත එන්නේ ව්‍යවස්ථාව වෙනස් කොට හෝ පිළිතුරු සෙවීමට ආණ්ඩුව තීරණය කිරීමත් සමගිනි.

පවත්නා ක්‍රමවේදයම යථාවත් කරලීමේ මගෙහිම යමින් සිටින මාලිමා පාලනයට අවසානයේදී ජේ.ආර්ගේ ව්‍යවස්ථාවේම එල්ලෙන්නට සිදුවූයේ ඒ අනුවය. අනුර පළමුව කීවේ රනිල්ගේ වැල්පාලමේ ඉතිරියත් තමන් විසින් ගමන් ගන්නා බවය. ඉන් මේ කොල්ලකාරී ආර්ථිකයට ඇති පක්ෂපාතීත්වය මහ දවාලේ පෙන්වීය. දැන් ඒ ඉතිරිය සඳහා අත්‍යවශ්‍ය නෛතික බලය වෙනුවෙන් ආධිකරණයේ සිය හිතෛෂි වන්තයයන් සොයා යාමේ මෙහෙයුම ආරම්භ කොට තිබේ. කුමක් වුවත් දෙසැම්බර් 01 දාට පෙර කෙසේ හෝ සම්මත කොට අවසන් කළ යුතු මේ මෙහෙයුම තනි පුද්ගල සාධකයක් වටා කැරකීම ආණ්ඩුවේ දේශපාලන සදාචාරයට ගෙන ආයේ මරු පහරකි. ජෙ. ආර්. බලය සඳහා තමන් සැදූ ව්‍යවස්ථාවට වරින් වර අවස්ථා ගණනාවකදීම අත්තනෝමතික සංශෝධන එල්ලු බව රහසක් නොවේ. ඔහු අග විනිසුරු තනතුර සඳහා තම හිතෛෂිවන්තයා සොයා ගත්තේ විනිසුරන්ගෙන් බාහිර කවයෙනි. ඒ නෙවිල් සමරකෝන් නැමැති නීතිවේදියා ජනාධිපති බලතල යොදා අගවිනිසුරු කරලීමය. එහෙත් අනුරට සිදුවූයේ විශ්‍රාම යාමට පෙර සිය හිතෛෂිවන්තයා තව දුරටත් තබා ගැනීම් වස් ව්‍යවස්ථාවට සංශෝධනයක් ගෙන ඒමය. එනිසා වඩා හානිකර පියවරකට මාලිමා පාලනය එක්වරම ඇදී ගියේ ඒ මගිනි.

බලය සම්බන්ධ දේශපාලනයට ඉතා පැහැදිලි පන්ති අර්ථයක් ගෙන එන අතර එයට රාජ්‍ය බලය යන්න කියවෙන්නේද එවැනිම බර තේරුමකිනි . එක් පන්ති බලයක් වෙනුවට වෙනත් පන්ති බලයක් එනම් වැඩකරන ජනයාගේ පන්ති බලයක් ස්ථාපිත කරලීම රාජ්‍ය බලය වැඩජරන ජනයා අතට ගැනීමෙන් මූලික ව සිදු කෙරේ. මෙවර සිදුව ඇත්තේ එවන් විප්ලවීය පරිවර්තනයක් නොව සාම්ප්‍රදායික දක්ශිණාංශය වෙනුවට නව දක්ශිණාංශයක් කැදවීමය. එනිසාම ආර්ථිකය නීතියද ඇතුළු පද්ධතිය සැකසෙන්නේ ද පැවති පදනම මතය.

මෙරට දේශපාලන ඉතිහාසයේ අපූරු පෙරළියක් සඳහා ආසන්න ගැටුම කැඳවූයේ 2022 අරගලයයි. එහි පතුලේම වූයේ පැවති දේශපාලන නායකත්වය මෙන්ම ආර්ථික ක්‍රමවේදයත් බැහැර කරලීමත් විකල්ප බලයක් ඉල්ලා සිටීමත් ය. එය පැරණි දේ වෙනුවට නව සම්ප්‍රදායක් sytem chenge එකක් ඉල්ලා සිටියේය. අරගලයේම පැවති සීමා මායිම් විසින් එය රැගෙන ආයේ දක්ශිණාංශික කදවුර වෙනුවට එයට එරෙහි පිළ නියෝජනය කල මාලිමාව වෙතය. පෙනුමින් කෙසේවෙතත් හරයෙන් මාලිමාව යන්න ඒ වෙන විටත් සැදී එහැදී සිටියේ පවත්නා දේම පිරිසිදු කරලීමය . කොටින්ම සෑම සියලු පාර්ශයවයන්ගෙන්ම පවත්නා දේ යළි පිහිටුවාලීම ය . එක හෙළාම පැවති නව ලිබරල් කොල්ලකාරී ආර්ථික පිළිවෙත ආරක්ෂා කිරීම හා ඒ මගෙහිම යාමය. එනිසා අරගලයේද ප්‍රකාශිත නව ව්‍යවස්ථාවක් යන්න මාලිමා පාලනයට හිස් වාක්‍යයක් පමණක් වීය. එවැන්නක් මුල් පියවරේම යෝජනා තලයට පැමිණියද ඒවා කෙටුම්පත් නොවීය. ඉතා දිගුකලක් මුළුල්ලේ විධායක බලය අහෝසි කිරීම වෙනුවෙන් අරගල කළ ව්‍යාපාරයක් නව ප්‍රජාතන්ත්‍රීය ව්‍යවස්ථාවක් වෙනුවෙන් දින වකවානු සකස් නොකිරීම අරබයා තේරුම් කරනුයේ කවරක්ද. ඒ වෙනුවට එහි විරුද්ධාභාශය වූ එකී ව්‍යවස්ථාවම වැළඳ ගැනීම දක්වා ආපසු හැරීයාම තුළ යළි යළිත් කියා පානුයේ කවරක්ද. එපමණක් නොව දැන් එහි පිහිට පැතීම දක්වා ඔවුන් ගමන් ආරම්භ කොට ඇත.

මින් කියා දෙන තවත් අපූරු සාකච්ඡාවක් ඇත්තේය. මාක්ස්ගේ අපූරු සටහනක් ඒ බව කියා දේ යුගයක රජයේ අදහස් වනාහි බලය හොබවන පාලක පන්තියේ අදහස් වන්නේය. තවත් සරලව කියනුයේ නම් නීතිය යනු පාලක පංතියේ කැමැත්ත යි.

එක්වරම අපට නැගෙනුයේ කවරක්ද මාලිමා ආණ්ඩුව පැරණි දක්ශිණාංශික හැඩහුරුව ගන්නේ කවර ආකාරයකින්ද මෙහිදී පෙන්වා දෙන කරුණු කිහිපයක් වේ. පළමු හා ප්‍රධාන කරුණක් වන්නේ පවත්නා කොල්ලකාරි ආර්ථිකය පවත්වා ගැනීම් වස් ඉතා කැපවීමෙන් ආණ්ඩුව පෙනී සිටින බවය. එහිලා ප්‍රාග්ධන ප්‍රසාරණයට හැකිතරම් ලිහිල් කිරීම් ගෙන ඒම එහි පරම ආරක්ෂකයා වීම ඒ වෙනුවෙන් නීතී අණ පනත් ස්ථාපිත කිරීම ට ආණ්ඩුව ක්‍රියාත්මකව ඇත. දැනටමත් තනි කම්කරු නීතිය, ආයෝජන ආරක්ෂණ පනත, ඇතුළු නීති පමණක් නොව ජෛවමිතික හැදුනුම්පත එළිදැක්වීමට කටයුතු කිරීම ඇතුළු නව ලිබරල් තලයේ ආන්දෝලනාත්මක නිතී සම්මත කිරිමට ආණ්ඩුව ලහි ලහියේ කටයුතු කටයුතු අරඹා ඇත. එය එක එල්ලේ අධිකරණ පද්ධතිය වෙත බලපාන බව කිව යුතු නොවේ. ප්‍රාග්ධන ප්‍රසාරණය යනු සුළු හා මධ්‍ය පරිමාණ වෙළෙඳ ව්‍යාපාර පවා ගිල ගනිමින් සිදුවන වෙළඳපොළ කඩා වැදීමකි . එය මෙරට ජනයාගේ දුගී භාවය තව දුරටත් උත්සන්න කරනු ඇත. මේ පෙනී සිටීම් නැවත නැවත කියා දෙමින් ඇත්තේ අපට ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය යන්න වත්මන් පාලනය තුළ මිත්‍යාවක් බවය. ආණ්ඩුව ඒ වෙනුවෙන් සිදුකරනුයේ සුපුරුදු අස්වැසුමෙන් සැනසීම ලබාදීමය.ආණ්ඩුවේ ප්‍රධාන වශයෙන් එල්ලය වී ඇත්තේ මහත් වෙර වැයමින් ඒ සඳහා පස සකස් කරලීමටය. නීතිය පාලකයාගේ කැමැත්ත ද ප්‍රාග්ධනයේ ආරක්ෂකයා වන්නේද එපරිද්දෙනි.

එනිසා මතුපිට සිදුවන්නට නියමිත දන්නා දක්ශිණාංශය වෙනුවට අලුත් දක්ශිණාංශයක් ජනතාවගේ ඇස්වලට වැලි ගසමින්. පාලන බලය සඳහා හරි බරි ගැසෙමින් ඇති අතර පැරණි දූෂිතයින් පෙන්වා දෙමින් සියල්ලන් වෙත දඩයම සඳහා බලපත්‍රයක් මින් අවසානයේ ආණ්ඩුව සතු කරගන්නවා ඇත.

**05 පිටුවෙන් ජඩ බදු ...**

බොන්න, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිලදී ගන්න, බෙහෙත් සහ සෞඛ්‍ය උපකරණ මිලදී ගන්න, තමන්ගේ දරුවාගේ පාසල් උපකරණ මිලදී ගන්න, තමන් පදින බයික් එකට තෙල් ටිකක් ගහගන්න, ඒ වගේම සිගරට් සහ මත්පැන්වලට. මේ විදිහට බැලුවම කම්කරුවන්ගේ වැටුප මුළුමනින්ම එදිනෙදා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට වැය කරන නිසා එම වැටුපෙන් සියයට 25 ක් බදු ලෙස ගෙවද්දීත්, ජනපතියගෙ ලාභයෙන් අය කරගන්නෙත් සියයට 30 ක බද්දක් විතරයි.

අපි ඉස්සරහ තියෙන අභියෝගය කුමක්ද?

ඒ විතරක් නෙවෙයි ධනපතියන්ට ඇති තරම් බදු සහන දීලා තියෙනවා. ලාභය මත බද්ද සියයට 30 අයකරන්නේ සාමාන්‍ය සමාගම්වලින් විතරයි. විශාල ආයෝජනවලට, අවුරුදු පහක් පහළොවත් අතර බදු විරාම ලබා දී තිබෙනවා. අපනයන සමාගම්වලින් අය කරන්නේ සියයට 15 වක බද්දක්. කෘෂිකර්මාන්තයට අදාළ සමාගම්වලින් අය කරන්නේ සියයට 10 ක බද්දක් විතරයි. මේ විදියට බැලුවම අපට තේරෙනවා බදු දැල පුළුල් කරනවා කියලා ඇත්තටම කරලා තියෙන්නේ මොකක්ද කියලා. සාමාන්‍ය ජනතාව මත බදු පැටවීම විතරයි.

අනෙක් බරපතළම කාරණාව තමයි ලාභය මත අය කරන බදුවලට ඉහත ප්‍රතිශත තිබුණාට එමගින් අපේක්ෂිත බදු ආදායම් ලැබෙනවද කියන එක 2023 දෙසැම්බර් 31ට රුපියල් බිලියන 1,066 ලැබිය යුතු බදු ආදායමක් ලැබිලා නැහැ. එයිනුත් රුපියල් බිලියන 878 ක් අභියාචනා නිසා ලබාගන්න බැරි වෙනව කියලා ආදායම් බදු දෙපාර්තමේන්තුව කියනවා. සමාගම් විසින් කරන බදු පැහැර හැරීම් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේදී හතර වතාවක් අධිකරණයට අභියාචනා ඉදිරිපත් කිරීමේ විශේෂ වරප්‍රසාද නීතියෙන් ලබා දී තිබෙන නිසා සමාගම් විසින් පැහැර හරින බදු නැවත අය කර ගැනීම ඉබ්බන්ගෙන් පිහාටු ගන්නවා වගේ වැඩක්. සාමාන්‍යයෙන් එවැනි නඩුවක් අවසන් වෙන්න අවුරුදු හතරක් ගියොත් හතර වතාවක් නැවත නැවත ඇපිල් කරන්න පුළුවන් නිසා අභියාචනා ඉවර වෙන්න අවුරුදු දාසයක් විතර යනවා. මේ අතර සාමාන්‍ය ජනතාව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී වැට් බදු ගෙව්වට ඒවා එකතු කරගෙන යන්නේ අදාළ සමාගම් විසින්ම යි.2023 අවසන් වන විට වැට් බදු පැහැර හැරීම රුපියල් බිලියන 369 ක්. මෙසේ පැහැර හරින ලද බද්දෙන් 2024 ජුනි වන විටත් අය කරගන්න පුළුවන් වෙලා තියෙන්නේ රුපියල් බිලියන 47ක් විතරයි. මේ නිසා සාමාන්‍ය ජනතාව ගෙවන බදු පවා සමාගම්වල අතිරේක ලාභයක් බවට පත් වී තිබෙන බව පෙනී යනවා.

දැන් අපි ඉස්සරහ තියෙන ප්‍රශ්නය මෙච්චරයි. මේ ජඩ බදු ප්‍රතිපත්තිය තවදුරටත් ඉදිරියට ගෙන යන්න ආණ්ඩුවට ඉඩ දෙනවද? කියන එක. අනෙක් පැත්තෙන්ම මේ ඉහළ යන ජීවන වියදම අනුව රාජ්‍ය පෞද්ගලික සහ වතුරේ සේවක වැටුප් වැඩි නොකර ලබන අයවැය සම්මත කරගන්න මේ ආණ්ඩුවට ඉඩ දෙනවද කියන එක. ඒ වගේම මේ තිත්ත බෙහෙත් වට්ටෝරුව අපට නියම කරපු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග 2027 මාර්තු නැවත ගිවිසුම්ගත වෙන්න ආණ්ඩුවට ඉඩ දෙනවද කියන එක. සම්බන්ධයෙන් දැවැන්ත විරෝධයක් ගොඩනගන්න සංවිධානය වෙන්න කියලා අපි කම්කරුවන් ඇතුළු සමස්ත ජනතාවගෙන් ඉල්ලා සිටිනවා.



# රඳවා තබන සිරගෙවල් සහ දෘෂ්ටිවාදී සිරගෙවල්



පසුගිය කාලයේ රජයේ බන්ධනාගාර කිහිපයකම රැඳවියන්ගේ කැරලිගැසීම් සහ නොසන්සුන්තා වාර්තා වුණා. ඒ සම්බන්ධයෙන් අපට විවිධාකාර අර්ථදැක්වීම් සහ විග්‍රහයන් අසන්නට ලැබුණා. ආණ්ඩුව පාර්ශවයෙන් කිව්වේ එක්කෝ මේ බන්ධනාගාර කැරලි විපක්ෂයේ කුමන්ත්‍රණ බව. නැතිනම් මත්ද්‍රව්‍ය බන්ධනාගාර තුළට ගෙනයාම මේ ආණ්ඩුවෙන් වැළැක්වූ නිසා මත්ද්‍රවවලට ඇබ්බැහි වුවන් නොසන්සුන් වීම ලෙස. මේ අතර ඊට ප්‍රතිපක්ෂව, මෙම කැරලි ගැසීම්වලට හේතුව බන්ධනාගාර තුළ ඇති තදබදය සහ අතිශය අමානුෂික පසුබිම බවට මත පළවුණා. පක්ෂය සිටියේත් එම කඳවුරේ. මේ අතර සමාජය පැත්තෙන් නරුමවාදී රැල්ලක් ගොඩ නැගුණා. එයින් කියැවුණේ සිරකරුවන් යනු අපරාධකරුවන් වන අතර ඔවුන් මරා දැමීම සාධාරණ බවයි. බන්ධනාගාරවලට මහජන බදු මුදලින් කිසිදු පහසුකමක් සැලසීමට විරුද්ධ බවයි. මේ මතවාදී කඳවුරු වෙත අවධානය යොමු කිරීමට පෙර අපි මදක් ඇතිවූ සිදුවීම්වල සංක්ෂිප්ත විස්තරයක් වෙත අවධානය යොමු කරමු.

සිට මේ වන විට වසර දෙකහමාරකට වැඩි කාලයක් ගත වුවත් 2026 අගෝස්තු 01 වනවිට එම ධාරිතාව වර්ධනය වී ඇත්තේ, 10,801ක් දක්වා පමණයි. නමුත් 2024 ජනවාරි වන විට රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව වන 29,000 වර්තමානය වන විට 41,000ක් දක්වා පමණ ඉහළ ගොස් තිබෙනවා. එයට මූලික වශයෙන් බලපෑවේ "ඉවත්වෙනු" නමින් ජාතික ජන බලවේග ආණ්ඩුව දීටත් කළ මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ "සංදර්ශනය" තුළ විශාල වශයෙන් තරුණයන් අත්අඩංගුවට ගැනීම. මීට පෙර "මතට තිත", "යුක්තිය" ආදී නම්වලින් කෙරුණු සංදර්ශනවලත් අවසන් ප්‍රතිඵලය වුයේ බන්ධනාගාර පිරී ඉතිරී යාම මිස මත්ද්‍රව්‍ය තුරන් වීම නෙවෙයි. මෙවරත් එහි වෙනසක් නෑ. මත්ද්‍රව්‍ය ලංකාවට ගෙන

| දිනය | බන්ධනාගාරය | මරණ ගණන | තුවාලලත් ගණන | උපරිම රැඳවියන් ධාර්තාව | සිටින රැඳවියන් ගණන |
|---|---|---|---|---|---|
| 2026 ජුලි 05 - 06 | මීගමුව බන්ධනාගාරය | 32 | 100+ | 496 | 2403 |
| 2026 අගෝස්තු 01 | මහර බන්ධනාගාරය | 01 | 06 | 991 | 4447 |
| 2026 අගෝස්තු 06 | නව මැගසින් බන්ධනාගාරය | 01 | 11 | 493 | 3046 |
| 2026 අගෝස්තු 07 | කුරුවිට බන්ධනාගාරය | 02 | 11 | 624 | 753 |

මෙම දත්ත දෙස බලන විට සිදුවූ දේ පැහැදිලියි. රඳවා තැබිය හැකි උපරිම ධාරිතාව මෙන් කිහිප ගුණයක් මෙම බන්ධනාගාරවල රඳවා තිබෙනවා. එවිට සාමාන්‍ය ලෙස ජීවිතයක් ගෙවිය නොහැකි තදබදයක් තිබෙනවා. ඒ නිසාම සියල්ලන්ට එකවර ගැනීමට පහසුකම් නැතිව වාර ක්‍රමයට නිදා ගැනීමට සිදුවෙනවා. වැසිකිලි පහසුකම් සහ ජලය ආදී අත්‍යවශ්‍ය පහසුකම්වල ප්‍රශ්න තිබෙනවා. කැරැල්ල ඇතිවන විට මහර බන්ධනාගාරයේ වැසිකිලි යාමට නොහැකි නිසා රැඳවියන් ආහාර නොගන්නා තත්වයක් පවා ඇතිව තිබු බව සඳහන් වුණා. මෙවැනි තත්වයක් යටතේ කැරලි ඇතිවීම සාමාන්‍යයි. පසුගිය කාලයේ අවධානයට යොමුවූ බන්ධනාගාරවලට වඩා ප්‍රශ්නය උග්‍ර වූ බන්ධනාගාර තිබෙනවා. පහත සටහන බලන විට ඔබට ඇතැම් බන්ධනාගාරවල ධාරිතාවය මෙන් හත් අට ගුණයක් රැඳවියන් සිටින බව පෙනී යාවි.

එන ජාවාරම්කරුවන් අල්ලා මිස මත්ද්‍රවවලට ඇබ්බැහි වුවන් සිරගත කර මෙම ප්‍රශ්නය විසඳන්න බෑ.

මෙහි තවත් පැති තිබෙනවා. පොලිස් නිලධාරීන්ගේ කාර්යසාධනය මනිනු ලබන්නේත් අත්අඩංගුවට ගන්නා සංඛ්‍යාවෙන්. යම් පොලිස් ස්ථානයක ගිය සතියේ මත්ද්‍රව්‍ය සමග තරුණයන් 40ක් අත්අඩංගුවට ගත්තානම් ස්ථානාධිපතිවරයා මේ සතියේ 50ක්වත් අත්අඩංගුවට ගත යුතුයි. නැතිනම් ඔහු රාජකාරිය ඉටු කිරීමට අසමත් කෙනෙකු ලෙස ලේබල් වී ඔහුගේ උසස්වීම් ඇතුළු සියල්ලට එය බලපානවා. සැබවින්ම පොලිස් නිලධාරියෙකුගේ කාර්යසාධනය මැනිය යුත්තේ අත්අඩංගුවට ගන්නා මත්ද්‍රව්‍ය සැකකරුවන් ප්‍රමාණයෙන් හෝ එකතු කළ රථවාහන දඩ මුදලින් නෙවෙයි.

| බන්ධනාගාරය | උපරිම ධාර්තාව | සිටින රැඳවියන් ගණන | ප්‍රතිශතය |
|---|---|---|---|
| ගාල්ල බන්ධනාගාරය | 233 | 2085 | 894.85% |
| කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | 328 | 2782 | 848.17% |
| වවුනියාව බන්ධනාගාරය | 45 | 343 | 762.22% |
| කෑගල්ල බන්ධනාගාරය | 136 | 877 | 644.85% |
| මැගසින් බන්ධනාගාරය | 499 | 3046 | 610.42% |
| මඩකලපුව බන්ධනාගාරය | 168 | 952 | 566.67% |

ඒ වගේම මෙම තදබදය දවසින් දවස ඉහළ යනවා 2024 වසරේ ජනවාරි 15 දිනට අදාළ වන එම දත්ත සහ .වර්තමාන දත්ත සසඳා බැලූ විට පෙනී යන කරුණක් වන්නේ බන්ධනාගාරගතව සිටින පිරිස සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බව. 2024 ජනවාරි වන විට බන්ධනාගාරවල රැඳවිය හැකි ධාරිතාව 10,312ක් වන අතර, එතැන්

එම පොලිස් බල ප්‍රදේශයේ අපරාධ අඩුවීම සහ රිය අනතුරු අඩුවීම ආදී වශයෙන් වූ නව නිර්ණායක අවශ්‍යයි. පොලීසිය ලකුණු දා ගැනීමට වැඩිපුර අත්අඩංගුවට ගන්නා අතර ඒ සියල්ලන් ඇප ලබාගත නොහැකිව රිමාන්ඩ් බන්ධනාගාරයේ පිරෙනවා. අන්තරායකර ඖෂධ පිළිබඳ නීති සකස් කර තිබෙන්නේත් ඇප ගැනීම අපහසු වන ආකාරයට.

සංශෝධිත, 1929 විෂ, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥා පනතේ 54 වන වගන්තිය පොලිසිය විසින් අනිසි ලෙස භාවිතා කිරීම, රිමාන්ඩ් බන්ධනාගාරවල තදබදයට ප්‍රධාන හේතුවක්. මහාධිකරණයක් විසින් සුවිශේෂී තත්වයන් යටතේ මිස, 54 වන වගන්තිය යටතේ චෝදනා එල්ල වී ඇති කිසිදු පුද්ගලයෙකුට ඇප ලබා දිය නොහැකි බව එහි සඳහන් වෙනවා. ඇප ලබා ගැනීමට නීතිඥයින්, මුදල් අත්‍යවශ්‍ය බව කවුරුත් දන්නවා. ඒ නිසා මහේස්ත්‍රාත්වරයාට ඇප දිය නොහැකි විටෙක මහාධිකරණයට ගොස් ඇප ලබා ගැනීම දුප්පතුන්ට දුෂ්කරයි. ඒ නිසා අධිකරණ අධීක්ෂණයක සේයාවක්වත් නොමැතිව 54 වන වගන්තිය මිනිසුන්ට දඬුවම් කිරීමේ මෙවලමක් ලෙස පොලිසිය භාවිතා කරනවා. මේ සඳහා නෛතික සංශෝධන අවශ්‍යයි. ඒ විතරක් නෙවෙයි, විෂ, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥා පනත යටතේ ගොනු කර ඇති නඩුවක් ඔප්පු කිරීම සඳහා, අත්අඩංගුවට ගැනීමට පදනම වන ද්‍රව්‍යය ඇත්ත වශයෙන්ම තහනම් ද්‍රව්‍යයක් ද යන්න සහ එය විවිධ වගන්ති යටතේ නියම කර ඇති සීමාවන් සපුරාලන්නේද යන්න පිළිබඳව ද විද්‍යාත්මක සාක්ෂි මහේස්ත්‍රාත්වරයා විසින් පරීක්ෂා කළ යුතුයි. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තාව ලැබෙන තුරු, සැකකරුවෝ රක්ෂිත බන්ධනාගාර ගතකර තබනවා. 2024 අවසානය වන විට මත්ද්‍රව්‍ය නාශක අංශයෙන් ලැබිය යුතු වාර්තා 17,671 ක් ගොඩගැසී ඇති බව දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවට වාර්තා කළා. නමුත් 2020 දී, ගොඩග ැසී තිබූ ප්‍රමාණය 5,873ක් පමණයි. ඒ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සිය ධාරිතාව වැඩි කර සිටියදීත්. 2020 දී පරීක්ෂා ක ර වාර්තා නිකුත් කළ 16,928 ක් වූ සාම්පල් ගණන 2024 දී 27,127 ක් ලෙස වැඩි වුවත් දෙපාර්තමේන්තුවට දැරිය නොහැකි තරම් වන ඉල්ලුම නිසා වාර්තා ගොඩගැසීම වැඩිවී තිබෙනවා.

රිමාන්ඩ් බන්ධනාගාරවල තදබදය අඩු කිරීම සඳහා රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව ආදී ආයතනවල කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීම වගේම පොලීසිය වැනි ආයතනවල කාර්යසාධනය මනින ආකාරයත් වෙනස් කළ යුතුයි. මුළු සිරකරුවන්ගෙන් 70%ක් පමණ වන රිමාන්ඩ් සිරකරුවන් නිසා බන්ධනාගාර තදබදයට විසඳුම් සෙවීමේදී පළමුව ඒ ගැන අවධානය යොමු කළ යුතුයි. 2024 දී කොළඹ පමණක් නිව් මැගසින් සහ කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරවල වරදකරුවන් නොවූ පිරිමින් 29,745ක් රඳවා සිටි අතර එය 2020 දී රඳවා සිටි 12,592ක් වූ ප්‍රමාණය මෙන් දෙගුණයකටත් වඩා වැඩියි. වැලිකඩ රඳවා සිටි කාන්තා රිමාන්ඩ් රැඳවියන් 2024 දී 2,692 ක් වූ අතර එය 2020 දී රිමාන්ඩ් කළ සංඛ්‍යාව මෙන් දෙගුණයකටත් වඩා වැඩියි. නීතියට අනුවත් රිමාන්ඩ් සිරකරුවෝ නිර්දෝෂී යැයි සලකනවා. අනෙක් සියලු රැඳවියන්ට වගේම රිමාන්ඩ් සිරකරුවන්ට මානුෂීය ලෙස සැලකීමේ අවශ්‍යතාව පිළිබඳව විවාදයක් තිබිය නොහැකියි.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුවන් ඒවා නොලැබෙන විට කැරලි ගසන බවට ආණ්ඩුව පවසන මතය ගැනත් අවසානයේදී වචනයක් කිව යුතුයි. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුවන් සිටිය යුත්තේ බන්ධනාගාරවල නෙවෙයි, පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ. ඔවුන් අධීක්ෂණය කළ යුත්තේ බන්ධනාගාර නියාමකයන් හෝ පොලීසිය නොව වෛද්‍යවරුන් සහ සෞඛ්‍ය වෘත්තිකයන්. ඒ වගේම බන්ධනාගාර, සිරකඳවුරු වැනි වචන භාවිතා කළාට මේවායේ නෛතික නම විශෝධන මධ්‍යස්ථාන. ඒ කියන්නේ වරදක් කළ අයෙකු මේවා තුළදී නැවත වරද නොකරන තත්වයට වර්ධනය විය යුතුයි. ලංකාවේ සිදුවන්නේ අනෙක් පැත්ත. ඔවුන් වඩා විශාල වැරදි සඳහා පොළඹවන්නේ බන්ධනාගාර තුළ තිබෙන පරිසරය. මේ සියල්ලේ විශාල වෙනසක් කරනවා මිස ජනාධිපතිවරයා කියන ලෙස මරණ දඬුවම දීමෙන් හෝ අධිකරණ ඇමතිවරයා කියන ලෙස මේවා කුමන්ත්‍රණ ලෙස වර්ගීකරණය කිරීමෙන් ප්‍රශ්නය විසඳෙන්නේ නෑ. මේ ප්‍රකාශවලින් පෙනෙන්නේ ජනාධිපතිවරයා සහ අධිකරණ ඇමතිවරයා ඇතුළු ආණ්ඩුවේ නායකයන්ගේ සහ ආණ්ඩු හිතවාදී බලවේගයේ දෘෂ්ටිවාදී සිරගෙය මිස ප්‍රශ්නය විසඳීමේ දේශපාලන ප්‍රවේශය නෙවෙයි.

# ජනතා ඉඩම් වෙළඳ භාණ්ඩයක් වූයේ කෙසේද?

ඉඩම යනු මිනිසාට ජීවත් වීමට, ආහාර නිෂ්පාදනය කිරීමට සහ අනාගත පරම්පරාවක් ගොඩනැඟීමට අවශ්‍ය මූලික සම්පතකි. විශේෂයෙන් ගොවි ජනතාවට ඉඩම යනු නිවසක් හෝ දේපළක් පමණක් නොව, ජීවිකාව සහ පවුලේ ආරක්ෂාව සමඟ බැඳුණු ජීවන සම්පතකි. එහෙත් අද ඉඩම දෙස බලන ආකාරය වේගයෙන් වෙනස් වෙමින් තිබේ. ඉඩමෙන් කොපමණ ලාභයක් උපයාගත හැකිද, එය කාට බදු දිය හැකිද, කුමන ආයෝජන ව්‍යාපෘතියකට යොදාගත හැකිද යන්න ඉඩම පිළිබඳ සාකච්ඡාවේ ප්‍රධාන ප්‍රශ්න බවට පත්ව ඇත.

ඒ නිසා ලංකාවේ ඉඩම් ප්‍රශ්නය ඔප්පුවක් තිබේද නැද්ද යන සරල ප්‍රශ්නයකට සීමා කළ නොහැකිය. ජනතාවගේ ජීවන සම්පතක් වූ ඉඩම ලාභ උපයන වෙළඳ භාණ්ඩයක් බවට පත් වූයේ කෙසේද, එම ක්‍රියාවලිය අද නව ලිබරල් ධනවාදය තුළ තවදුරටත් ඉදිරියට යන්නේ කෙසේද යන්න විමසා බැලිය යුතුය.

## ඉඩම සහ ගොවියා

ලංකාවේ පැරණි කෘෂිකර්මාන්තය තුළ ඉඩම සහ ගොවියා අතර තිබුණේ අද පවතින ආකාරයේ වෙළඳපොළ සම්බන්ධතාවක් නොවේ. වැව, කුඹුර, ගම සහ ගොවියා එකිනෙකට සම්බන්ධ වූ සමාජ ආර්ථික පද්ධතියක් පැවතිණි. රජුට ඉඩම්වලින් බදු ලබාගැනීමේ බලය තිබුණද, ගොවියා තම ජීවිතය සහ නිෂ්පාදනය ඉඩම සමඟ ඍජුව බැඳගෙන සිටියේය. විහාර හා දේවාල නඩත්තුව සඳහා ඉඩම් පවරා දීමත්, විවිධ සේවාවන් වෙනුවෙන් ඉඩම් ලබාදීමත් සිදුවිය.

එබැවින් අතීත ඉඩම් සම්බන්ධතා සියල්ල සාධාරණ වූ බවක් මෙයින් අදහස් නොවේ. එහෙත් ඉඩම අද මෙන් ප්‍රධාන වශයෙන් මිලදී ගැනීමට, විකිණීමට සහ ආයෝජනය කිරීමට ඇති වෙළඳ භාණ්ඩයක් බවට පත්ව තිබුණේ නැත.

විහාර දේවාලගම් නීති යටතේ පවතින ඇතැම් ඉඩම් පරම්පරා ගණනාවක් තිස්සේ ජනතාව භුක්ති විඳින නමුත්, එම භුක්තිය සහ පරම අයිතිය අතර අදත් පරතරයක් තිබේ. එවැනි ඉඩම් සඳහා බදු ගෙවීමට සිදුවීමත්, ඉඩම පැවරීම හෝ උකස් කර ණයක් ලබාගැනීමේදී සීමාවන්ට මුහුණදීමත් ජනතාවට ආර්ථික පීඩනයක් ඇති කරයි. දඹුල්ල වැනි ප්‍රදේශවල එවැනි ඉඩම් ගැටලු අධිකරණය දක්වා ගොස් තිබේ.

ඓතිහාසික උරුමයන් ආරක්ෂා කිරීමත්, එම ඉඩම් භුක්ති විඳින ජනතාවගේ ජීවන අයිතිය ආරක්ෂා කිරීමත් එකිනෙකට විරුද්ධ කරුණු නොවේ. ඒ දෙකම සාධාරණ නීතිමය පදනමක් තුළ විසඳිය යුතු ප්‍රශ්න වේ.

## ඉඩමට මිලක් ලැබුණු හැටි

බ්‍රිතාන්‍ය පාලනය ලංකාවේ පැරණි ඉඩම් සම්බන්ධතා වෙනස් කළේය. 1840 කිරීට ඉඩම් ආඥා පනත සහ 1897 මුඩුබිම් ආඥා පනත වැනි නීති මඟින් අයිතිය තහවුරු කළ නොහැකි හෝ වගා නොකළ ඉඩම් රාජ්‍ය සන්තකයට ගැනීමට මාර්ගය සකස් විය. පාරම්පරිකව භුක්ති විඳි ඉඩම් සම්බන්ධයෙන් ජනතාව සතුව තිබූ අයිතිවාසිකම් දුර්වල විය.

තේ, රබර් සහ කෝපි වැනි අපනයන බෝග සඳහා විශාල ඉඩම් ප්‍රදේශ යොදාගැනීමත් සමඟ ඉඩම තවත් ආකාරයකින් වෙනස් විය. එය මිනිසුන්ගේ ජීවිතය පවත්වාගෙන යන භූමියක් පමණක් නොව, වෙළඳපොළ සඳහා නිෂ්පාදනය කර ලාභ උපයාගත හැකි සම්පතක් බවට පත්විය.

ඉඩමෙන් මිනිසාට අවශ්‍ය දේ නිෂ්පාදනය කරනවා වෙනුවට, වෙළඳපොළට අවශ්‍ය දේ නිෂ්පාදනය කර ලාභ උපයාගැනීමේ ක්‍රමය ශක්තිමත් විය.

නිදහසට පෙර සිටද පසුව රාජ්‍ය ඉඩම් ගොවි ජනතාව අතර බෙදාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක විය. 1935 ඉඩම් සංවර්ධන ආඥා හා පනත, ගොවිජනපද ව්‍යාපාර මහවැලි ව්‍යාපාරය ද ඒ අතර වැදගත්ය. 1972 ඉඩම් ප්‍රතිසංස්කරණයද විශාල පෞද්ගලික ඉඩම් හිමිකාරිත්වයට සීමා පැනවූ තවත් පියවරක් විය.

එහෙත් පසුව රාජ්‍ය වතු ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ විශාල ඉඩම් ප්‍රමාණයක ආර්ථික පාලනය සමාගම් වෙත ගියේය. දිගුකාලීන බදු සහ සමාගම් පාලනය හරහා ඉඩමේ ආර්ථික බලය සමාගම් අතට යාමට මාර්ගය විවෘත විය.

ඉඩමෙන් ලැබෙන නිෂ්පාදනය සහ ලාභය කා අතට යන්නේද යන්න තීරණාත්මක කරුණක් බවට පත්විය.

## ගොවියා හිමිකරුවාගෙන් කම්කරුවාට

ඉඩම් සමාගම්කරණයේ ගැඹුරුම ප්‍රතිඵලය ඉඩම අහිමිවීම පමණක් නොවේ. තමන්ගේ ඉඩමේ නිෂ්පාදකයෙකු ලෙස සිටි ගොවියා වෙනත් කෙනෙකුගේ ඉඩමක වැටුපට වැඩ කරන කම්කරුවෙකු බවට පත්වීම එහි අවසාන ප්‍රතිඵලයක් විය හැකිය.

මෙය සෑම විටම බලහත්කාරයෙන් සිදු නොවේ. ණය බර, නිෂ්පාදන වියදම් ඉහළ යාම, අස්වැන්නට සාධාරණ මිලක් නොලැබීම සහ ඉඩමේ මිල ඉහළ යාම වැනි කරුණු එකට ක්‍රියා කරයි. අවසානයේ ගොවියා තම ඉඩම විකුණා දමන තත්වයට පත්විය හැකිය.

එවිට ඉඩම සමාගම සතු වේ. ගොවියා එම ඉඩමේම කම්කරුවෙකු බවට පත්වේ.

ඉඩම සහ ගොවියා අතර තිබුණේ අද පවතින ආකාරයේ වෙළඳපොළ සම්බන්ධතාවක් නොවේ. වැව, කුඹුර, ගම සහ ගොවියා එකිනෙකට සම්බන්ධ වූ සමාජ ආර්ථික පද්ධතියක් පැවතිණි. රජුට ඉඩම්වලින් බදු ලබාගැනීමේ බලය තිබුණද, ගොවියා තම ජීවිතය සහ නිෂ්පාදනය ඉඩම සමඟ ඍජුව බැඳගෙන සිටියේය. විහාර හා දේවාල නඩත්තුව සඳහා ඉඩම් පවරා දීමත්, විවිධ 'වාවන් වෙනුවෙන් ඉඩම් ලබාදීමත් සිදුවිය. එබැවින් අතීත ඉඩම් සම්බන්ධතා සියල්ල සාධාරණ වූ බවක් මෙයින් අදහස් නොවේ. එහෙත් ඉඩම අද මෙන් ප්‍රධාන වශයෙන් මිලදී ගැනීමට, විකිණීමට සහ ආයෝජනය කිරීමට ඇති වෙළඳ භාණ්ඩයක් බවට පත්ව තිබුණේ නැත.





ඔහුගේ ශ්‍රමය තවත් අයෙකුගේ ලාභය වැඩි කිරීමට යොදාගැනේ.

ඉඩම අහිමි වීමේ සැබෑ අර්ථය තේරුම් ගත යුත්තේ මෙතැනිනි.

## උතුරේ ඉඩම තවමත් අයිතියක් නොව ප්‍රශ්නයක්

ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්නය උතුරේදී තවත් තියුණු ස්වරූපයක් ගනී. යුද්ධය හේතුවෙන් තම ඉඩම් අහිමි වූ ජනතාව අතරින් බොහෝ දෙනෙක් අදත් ඒවා නැවත ලබාගැනීමේ අරගලයක සිටිති.

පලාලි අධි ආරක්ෂිත කලාපයට අදාළව යුද හමුදාව භාවිත කරන අක්කර 1,661ක් හමුදාව වෙත විධිමත්ව පවරා ගැනීමේ කටයුතු සහ ඉඩම් හිමි ජනතාවට වන්දි ගෙවීමේ කටයුතු සිදුවන බව පාර්ලිමේන්තුවේදී සඳහන් වී තිබේ. වලිකාමම් උතුරේ අක්කර 2,506ක පමණ ඉඩම් සම්බන්ධයෙන්ද ජනතාවගේ අයිතිය පිළිබඳ ගැටලු පවතී.

මෙහි ප්‍රශ්නය ජාතික ආරක්ෂාව නොසලකා හැරීම නොවේ. තමන්ගේ පරම්පරාගත ඉඩම පිළිබඳ තීරණ ගැනීමේ අයිතිය ජනතාවට තිබිය යුතුය යන්නයි. උතුරේ ඉඩම් ප්‍රශ්නයට විසඳුමක් නොදී රටේ ඉඩම් ප්‍රතිපත්තියක් ගැන සම්පූර්ණ කතාබහක් කළ නොහැකිය.

## ඉඩම ලාභයටද? ජන අයිතියටද?

අද අප මුහුණ දෙන්නේ පැරණි ක්‍රියාවලියේ නව අවස්ථාවකටය. නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය යටතේ රාජ්‍ය සම්පත් ආයෝජනයට සහ පෞද්ගලික ව්‍යාපාර සඳහා වැඩි වශයෙන් විවෘත කිරීමේ ප්‍රවණතාවක් පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ක්‍රියාත්මක වැඩසටහන තුළද රාජ්‍ය සම්පත් වඩා කාර්යක්ෂමව භාවිත කිරීම සහ පෞද්ගලික ආයෝජන පුළුල් කිරීම පිළිබඳ අවධානය යොමු වී තිබේ.

මෙය "ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉඩම් විකුණන්න කියයි" යන සරල ප්‍රකාශයකට සීමා කළ නොහැකිය. එහෙත් රාජ්‍ය සම්පත් වෙළඳපොළට වැඩි වශයෙන් විවෘත කරන විට ඉඩමද ලාභ උපයන ආයෝජන සම්පතක් බවට පත්වීමේ අවදානම වැඩි වේ.

එබැවින් විසඳුම වන්නේ සමාගම්වලට ඉඩම් ලබාදීම තවදුරටත් පුළුල් කිරීම නොවේ. වගා කළ හැකි ඉඩම් ආරක්ෂා කළ යුතුය. ඉඩම් විශාල වශයෙන් සමාගම් අතට එකතු වීම සීමා කළ යුතුය. ඉඩම් නැති ගොවීන්ට ඉඩම් ලබාදිය යුතු අතර, කුඩා ගොවියාට බීජ, ජලය, ණය, තාක්ෂණය, ගබඩා පහසුකම් සහ සාධාරණ වෙළඳපොළක් ලබාදිය යුතුය.

ඉඩම තවත් වෙළඳ භාණ්ඩයක් බවට පත් කරනවාද? නැතිනම් එය ජන අයිතියක් බවට පත්වන ප්‍රතිපත්තියක් ගොඩනඟන වැඩපිළිවෙළක් වෙනුවෙන් සටන් කරනවාද යන්න අද දවසේ ඇති අභියෝගය ලෙස මඟහැරිය නොහැක.



# ආසියානු කලාපයේ එක්සත් ජනපද බලපෑම්

මැද පෙරදිග ඇතිව තිබෙන යුදමය තත්වය හමුවේ එක්සත් ජනපදයේ ආසියා-පැසිෆික් කලාපය සම්බන්ධ උපායමාර්ගය අනතුරට ලක්ව ඇතැයි දේශපාලන විචාරකයන් සඳහන් කරයි. එහිදී විදෙස් මාධ්‍ය වාර්තා කර තිබූ විශේෂ සිදුවීමක් වූයේ ජපානය ආශ්‍රිතව නවතා තිබූ යුද ප්‍රහාරක යානා රැගෙන නෞකාවක් වන යන ජෝජ් වොෂිංටන් මැදපෙරදිග වෙත ගෙනයාමයි. එය නැවතත් දින කිහිපයක නැවත ආසියාව බලා යාත්‍රා කළත් මෙය ආසියානු කලාපයේ එක්සත් ජනපද මිත්‍ර රටවල අවධානයට යොමුවූ කරුණක් වී තිබුණි. මේ අතර තායිවානයේ නැගෙනහිර මුහුදේ චීන වෙරළාරක්ෂක ක්‍රියාකාරකම් ජුනි මාසයේ සිට ඉහළ ගොස් ඇති බව ද දක්නට ලැබේ.

මේ තත්වය හමුවේ එක්සත් ජනපදය ආසියාවෙන් ඉවත් නොවන බවත්, ඉන්දු පැසිෆික් කලාපය තුළ තමන්ට වාසිදායක බලතුලනයක් පවත්වාගෙන යාම සඳහා 'තවදුරටත් ස්ථාවර වෙමින්' සිටින බවත්, තම මිත්‍ර රටවල් ඔවුන්ගේ ආරක්ෂාව සඳහා වැඩි වගකීමක් දැරිය යුතු යැයි අපේක්ෂා කරන බවත් ප්‍රතිපත්ති සඳහා ආරක්ෂක උප ලේකම් එල්බ්‍රිජ් කොල්බි පවසා තිබුණි.

එල්බ්‍රිජ් කොල්බි මෙසේ පැවසුවේ පිලිපීනයේ මැනිලා අගනුවරදියි. එල්බ්‍රිජ් ලිපීනය, ඉන්දුනීසියාව, තායිලන්තය සහ කාම්බෝජය යන රටවල් ඇතුළත් අග්නිදිග ආසියානු කලාපයේ සංචාරයක නිරතවෙමින් සිටියි.

එක්සත් ජනපද උපායමාර්ගය ඇමරිකානු බලකායන් මත පමණක් පදනම් විය නොහැකි බව පැවසූ ඔහු, මිත්‍ර පාක්ෂිකයන් තම ආරක්ෂාව වෙනුවෙන් වැඩි වැඩියෙන් ආයෝජනය කළ යුතු බවද පවසා තිබේ. කෙසේ වෙතත්, ට්‍රම්ප් පරිපාලනයේ මෑතකාලීන ක්‍රියාමාර්ගවලින් පෙන්නුම් කරන්නේ ඊට පටහැණි දෙයකි. එනම් අවශ්‍යතාව සහ තේරීම මත එක්සත් ජනපදයේ ප්‍රමුඛතාවයන් ආසියාවෙන් ඉවතට යොමු වෙමින් පවතින බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස, එක්සත් ජනපදයෙන් තවදුරටත් ආරක්ෂාවක් ලැබීම ගැන තවදුරටත් විශ්වාසය තැබිය නොහැකි බවට ආසියානු මිත්‍ර පාක්ෂිකයින් සහ හවුල්කරුවන් අතර කංසාව වැඩිවෙමින් පවතින බව දේශපාලන විචාරකයන්ගේ අදහසයි. එය ඔවුන් චීනයට සමීප වීමට හෝ තම ආරක්ෂාව ස්වාධීනව සපයා ගැනීමට යාමෙන් හෝ කලාපීය අවි තරඟයකට මග පාදනු ඇති බවටද මත පළවේ.

එක්සත් ජනපදයේ මෑතකාලීන ක්‍රියාමාර්ග මගින් මෙම තත්වය තවදුරටත් තහවුරු විය. දකුණු කොරියාව සමග පැවැත්වීමට නියමිතව තිබූ ඒකාබද්ධ යුද අභ්‍යාස ආරම්භ කිරීමට පැය කිහිපයකට පෙර, එය සීමා කරන ලෙස ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පසුගිය සති අන්තයේ පෙන්ටගනයට නියෝග කළේ පූර්ව දැනුම්දීමකින් තොරවය. ජනාධිපතිවරයාගේ මෙම තීරණයට හේතුව පැහැදිලි නැත. ඔහු අභ්‍යාස සඳහා යන පිරිවැය සඳහන් කළ අතර, ඔහුගේ දෙවන ධුර කාලය තුළ උතුරු කොරියාවෙන් තර්ජනයක් නොවූල බව ප්‍රකාශ කර ඇත.

මෙම තීරණය හේතුවෙන් දකුණු කොරියාව තුළ එක්සත් ජනපදය කෙරෙහි පවතින ප්‍රසාදය තවදුරටත් පහත වැටෙනු ඇත. මීට පෙරද, දකුණු කොරියාවේ ස්ථාපිත කර තිබූ Terminal High Altitude Area Defense (THAAD) මිසයිල ආරක්ෂණ පද්ධති මැදපෙරදිග භාවිතය සඳහා ඉවත් කර ගැනීමට පෙන්ටගනයට සිදු වූ බව වාර්තා වූ අතර, එයද සෝල් පාලනයේ නොසන්සුන්තාවයට හේතු විය.

ඒ අතරම, ට්‍රම්ප් පරිපාලනය විසින් තායිවාන් සමුද්‍ර සන්ධිය හරහා සිදුකරන එක්සත් ජනපද නාවික ගමන් සැලකිය යුතු ලෙස අඩු කර ඇති බව Heritage Foundation අධ්‍යයනයක් පෙන්වා දෙයි. ට්‍රම්ප්ගේ දෙවන ධුර කාලය තුළ මෙම ගමන් ප්‍රමාණය ඔහුගේ පළමු ධුර කාලයට වඩා 50% කින්ද, බයිඩන් පාලන සමයට වඩා 56% කින්ද පහත වැටී ඇත.

මෙම වෙනස තායිවානය අසල පමණක් නොව, දකුණු චීන මුහුදේ මතභේදාත්මක මුහුදු සීමාවන්හි එක්සත් ජනපද යුද නෞකා විසින් සිදුකරන නාවික නිදහස පිළිබඳ මෙහෙයුම් (FONOPS) සංඛ්‍යාවද ට්‍රම්ප් පරිපාලනය විසින් අඩු කර ඇත. ට්‍රම්ප්ගේ පළමු ධුර කාලය තුළ, චීනය වැළැක්වීම සඳහා එක්සත් ජනපද නෞකා දකුණු චීන මුහුදේ අවම වශයෙන් මෙහෙයුම් හතක්වත් වසරකට සිදු කළ බව වාර්තා විය. නමුත් ට්‍රම්ප්ගේ දෙවන ධුර කාලයේ පළමු මාස හය තුළ එක්සත් ජනපදය එවැනි එකදු මෙහෙයුමක්වත් සිදු කර නොමැත.

මේ අතර භාණ්ඩාගාර ලේකම් ස්කොට් බෙසන්ට් 'ආර්ථික D-Day ලෙස හැඳින්වූ පියවරක් ඉරානයට එරෙහිව ආරම්භ කිරීමට ට්‍රම්ප් පරිපාලනය අගෝස්තු මැදදී කටයුතු කරන ලදී. ඒ අනුව, ටෙහෙරානය සමග ගනුදෙනු කරන සෑම රටකටම, බැංකුවකටම සහ සමාගමකටම එරෙහිව ද්විතියික සම්බාධක පැනවීමට නියමිතය. ඇමරිකානු තහංචිවලට පෙර ඉරාන තෙල් අපනයනයෙන් දහයෙන් නවයක්ම ලබාගත් චීනය මීට ප්‍රධාන වශයෙන් ඇතුළත් වේ.





## චීනයේ නිවේදනය

චීනයේ විදේශ අමාත්‍යාංශයේ ප්‍රකාශක ලින් ජියැන් පැවසුවේ, 'නීති විරෝධී ඒකපාර්ශ්වික සම්බාධක' ලෙස හඳුන්වන දෙයට චීනය තදින්ම විරුද්ධ වන අතර තම අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා 'සියලු' අවශ්‍ය පියවරල ගන්නා බවයි.

මෙම නිවේදනය නිකුත් වන්නේ ලබන මාසයේදී ට්‍රම්ප් සහ චීන ජනාධිපති ෂී ජින්පින් අතර පැවැත්වීමට නියමිත සාකච්ඡාවලට පෙර වීම විශේෂත්වයකි.

ලොව දුර්ලභ පස් (rare earths) සහ තාක්ෂණික නිෂ්පාදන සඳහා අත්‍යවශ්‍ය අනෙකුත් වැදගත් ඛනිජවලින් වැඩි ප්‍රමාණයක් පිරිපහදු කරන බීජිං වෙතින් එල්ල විය හැකි ප්‍රතිචාර පිළිබඳව වොෂින්ටනය අවධානයෙන් සිටීමට ඉඩ ඇත. එක්සත් ජනපදය සමග පැවැති පූර්ව වෙළෙඳ සාකච්ඡාවල කොටසක් ලෙස බීජිං පාලනය විසින් දුර්ලභ පස් අපනයන පාලනය කර තිබුණි.

එක්සත් ජනපද නිවේදනයෙන් බලපෑමට ලක්විය හැකි අනෙකුත් වෙළෙඳ හවුල්කරුවන් අතර ඉන්දියාව සහ රුසියාව ඇතුළත් වන අතර, ඔවුන් තවමත් ඊට ප්‍රතිචාර දක්වා නොමැත.

## යුදමය තත්වය හමුවේ ලංකාව




මැදපෙරදිග දැනට පවතින අර්බුදය හේතුවෙන් ගෝලීය තෙල් මිල ඉහළ යමින් පවතින අතර, එය ලංකාවේ දේශීය ඉන්ධන පිරිවැයට සහ ආර්ථිකයට තවදුරටත් දැඩි බලපෑමක් එල්ල කිරීමට ඉඩ තිබේ. මැදපෙරදිග කලාපයේ සැපයුම් පිළිබඳ අවිනිශ්චිතතාවය සහ බාධා කිරීම් හේතුවෙන් බ්‍රෙන්ට් (Brent) බොරතෙල් ලීටරයක මිල ඩොලර් 94 දක්වා ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකා රජය මාස කිහිපයක සිට තෙල් මිල ඉහළ නොදමා පවත්වා ගැනීමට උත්සාහ කරමින් සිටින නමුත් මෙම තත්ත්වය හමුවේ එය වෙනස් වීමට ඉඩ ඇත. මන්ද ලෝක වෙළඳපොලේ තෙල් මිල අඩුව තිබියදී පවා ලංකාවේ තෙල් මිල වැඩිකරන ලදී. ඊට අමතරව ඉහළ යන තෙල් මිල සහ රුපියල අවප්‍රමාණය වීම සමස්ත ආනයන වියදම ඉහළ නංවමින් විදේශ විනිමය සංචිත කෙරෙහි දැඩි පීඩනයක් එල්ල කිරීමට ඉඩ තිබේ.

# අවම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

2026 සැප්තැම්බර්




ධීවරයා මුහුණ දී ගැටලු සම්බන්ධයෙන්, අගෝස්තු 24 වැනිදා ධීවර අමාත්‍යාංශය සහ ධීවර සංවිධාන එකමුතුව අතර සාකච්ඡාවක් ජන අරගල ව්‍යාපාරයේ මූලිකත්වයෙන් පැවැත්වුණු අතර ඉන්පසුව පැවැති මාධ්‍ය හමුවට යාපනය, කයිට්ස්, පේදුරුතුඩුව ඇතුළු ප්‍රදේශවල ධීවර නියෝජිතයින් සම්බන්ධ විය.



යෝජිත 22වන ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සාකච්ඡාවක් නීතිඥ සංගමය සහ වෘත්තිය සමිති, බහුජන සංවිධාන සහභාගිත්වයෙන් අගෝස්තු 13 කොළඹ නීතිඥ සංගම් කාර්යාලයේදී පැවැති සාකච්ඡාවට කම්කරු අරගල මධ්‍යස්ථානයද සම්බන්ධ විය.



පල්ලේගම හේමරතන භික්ෂුව චෝදනාවට ලක්ව සිටින අපයෝජන සිද්ධියේදී යුක්තිය ඉටු කිරීමේ ප්‍රමාදය මෙන්ම දරුවන්ට සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයන්ට සහ හිංසනයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වීමේ ඇති ප්‍රමාදයන් සහ දුර්වලතාවයන් පිළිබඳව දේශපාලන ක්‍රියාකාරීන් සහ සමාජ ක්‍රියාකාරීන් පිරිසකගේ සහභාගිත්වයෙන් පැවති මාධ්‍ය හමුවට නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරයේ නියෝජිතයන්ද සිය අදහස් එකතු කරන ලදී.



22 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුව අධිකරණයට මැදිහත්වීමමේ ගැටලු සහ විරුද්ධව විපක්ෂයේ වංචනික මැදිහත්වීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා පෙරටුගාමී සමාජවාදී පක්ෂය විසින් රට පුරා ක්‍රියාත්මක කළ අත්පත්‍රිකා බෙදා හැරීම





'සබන් බෝල ආර්ථිකය - හතිවැටිච්ච ජීවිතය' තේමාවෙන් අගෝස්තු 11 වැනිදා ඇඹිලිපිටිය සෆායර් උත්සව ශාලාවේදී පැවැති සම්මන්ත්‍රණයේ දේශනයට පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම කාරක සභික සුජිත් කුරුවිට සහෝදරයා සහභාගි විය.





'සබන් බෝල ආර්ථිකය - හති වැටිච්ච ජීවිතය' යන තේමාවෙන් ගාල්ල දිස්ත්‍රික් සම්මන්ත්‍රණය අගෝස්තු 14 වැනිදා පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ පාලක ලේකම් රවීන්ද්‍ර මුදලිගේ සහෝදරයාගේ සහභාගිත්වයෙන් ගාල්ල නගර සභා ශාලාවේදී පැවැත්වුණි.




'ගොවිතැනේ ලාභය උන්ටද අපටද?' තේමාවෙන් සැප්තැම්බර් 1 වැනිදා පුත්තලම, සාලිය වැව පැවැති ගොවි හමුවට, ගොවි අරගල ව්‍යාපාරය වෙනුවෙන් සංජීව බණ්ඩාර සහෝදරයා සහභාගි විය.



වී මිල ගැටලුව පිළිබඳව කන්තලේ නගරයේදි පැවැති උද්ඝෝෂණයට ගොවි අරගල ව්‍යාපාරය එක් විය.



මෙරට ඛනිජ සම්පත් කොල්ලකෑමට සමාගම්වලට ඉඩදෙන ක්‍රියාමාර්ග වෙනස් නොකිරීම හා නැවත වතාවත් දූෂිත සමාගම් වලටම ඛනිජ කැනීම් බලපත්‍ර නිකුත් කිරීමට සූදානම්වීම පිළිබඳ විරෝධය පළ කිරීම සහ කරුණු විමසීම සඳහා YOUTH FOR CHEnge නියෝජිතයෝ සැප්තැම්බර් 3වැනිදා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය වෙත ගියහ.




අර්ථසාධකයට අත නොතබනු! සහ අරමුදල් පාලනය හාම්පුතුන්ට පවරන ත්‍රෛපාර්ශ්වික පිල්ලිය වහා හකුලා ගනු! යන සටන්පාඨ ඔස්සේ අගෝස්තු 17 පැවැති විරෝධතාව



සෞඛ්‍ය සේවක බලය පෙන්වමු! සටන දිනමු! යන තේමාවෙන් කොළඹ මහවැලි කේන්ද්‍රය ශ්‍රවණාගාරයේදී පවත්වන අගෝස්තු 07 ඒකාබද්ධ සෞඛ්‍ය සේවක සංගමයේ 11 වන මහා සම්මේලනයේ තෝරාපත් කරගන්නා ලද නියෝජිතයෝ

ඡන්දෙට කලින් දුන් පොරොන්දු අමතකද.? ආහාර - සෞඛ්‍ය සේවා - පාසල් උපකරණ බදු ඉවත් කරනු.! ජඩ බදු හකුලා ගනිව්! යන සටන් පාඨ ඔස්සේ ජන අරගල ව්‍යාපාරය විසින් දිවයින පුරා ක්‍රියාත්මක කළ බදු විරෝධතා












අංක 22/1, මෙල්ඩර් පෙදෙස, නුගේගොඩ යන ලිපිනයේ පදිංචි පුබුදු ජයගොඩ වන මා විසින් අංක 271/, රත්නපුර පාර, හොරණ හි පිහිටි ස්ටාර් ප්‍රින්ටර්ස් හි මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදි.